# 2022

## වාර්ෂික වාර්තාව
## ஆண்டறிக்கை
## Annual Report

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்

**National Film Corporation of Sri Lanka**

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# වාර්ෂික වාර්තාව
# 2022

**පිළිගැන්වීම**

දිනය - 2023.05.24

මගේ අංක NFC/119/02/01/01 - 2022

ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින්,

ආචාර්යබන්දුල ගුණවර්ධනමැතිතුමා
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
163, "ඇසිදිසි මැදුර",
කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**වාර්ෂික වාර්තාව -2022**

1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරනශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පහත සඳහන් ලේඛන ද සමග සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2022 වසරේ සංස්ථාව විසින් කරන ලද කාර්යයන් හා අදාළ ප්‍රකාශ
2. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සංස්ථාවේ ලාභලාභ ගිණුම්, ආශ්‍රිත සටහන් හා එදිනට ශේෂ පත්‍රය
3. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණකාධිපති වාර්තාව

මෙයට විශ්වාසී වූ,

ජී. ඒ. කිත්සිරි
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

අත්සන් කළේ - නිතීඥ දීපාල් චන්ද්‍රරත්න
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# පාලන වාර්තාව

01. හැඳින්වීම
02. අධ්‍යක්ෂ මණ්ඩලය
03. දේශීය චිත්‍රපට නිෂ්පාදනය
04. මානව සම්පත් හා පරිපාලන කටයුතු
05. චිත්‍රපට ප්‍රචාරණය/ සිනේ ඇඩ්ස්
06. සිනමා සංස්කෘතිය හා අධ්‍යාපන කටයුතු
07. චිත්‍රපට ප්‍රදර්ශනය
08. දේශීය සැපයුම් - ආනයන හා අපනයන
09. විගණන කටයුතු
10. මූල්‍ය කටයුතු
11. නෛතික කටයුතු
12. චිත්‍රාගාරය
13. විමර්ශන කටයුතු
14. සැලසුම් සංඛ්‍යාලේඛන හා පුහුණු
15. වෛද්‍යාධාර
16. සුබසාධනය
17. ආගමික කටයුතු
18. ක්‍රීඩා සංගමය
19. වෘත්තීය සමිති
20. ස්තූතිය

## 01. හැඳින්වීම

1980 අංක 45 දරන පනතින් සංශෝධනය කළ 1971 අංක 47 දරනශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ ජනමාධ්‍ය අමාත්‍යආචාර්ය බන්දුල ගුණවර්ධන මැතිතුමාහා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2022 වර්ෂය පිළිබඳ වාර්තාව.

2022 වර්ෂය පිළිබඳ ඉදිරිපත් කරන මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 50 වන ක්‍රියාත්මක වර්ෂයට අදාළ වේ.

## 02. අධ්‍යක්ෂ මණ්ඩලය

2022 වර්ෂය තුළ ජාතික චිත්‍රපට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විතව ඇත.

2022.01.01 සිට 2022 මැයි මාසය තෙක් වරින් වර පත්වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්

| | | |
|---|---|---|
| 01. | ආචාර්ය ජයන්ත ධර්මදාස | සභාපති<br>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව |
| 02 | මොහාන් සමරනායක මහතා | ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්<br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව |
| 03 | චන්ද්‍රපාල ලියනගේ මහතා | අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව |
| 04 | තරණි අනෝජා ගමගේ මහත්මිය | සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ<br>සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව |
| 05 | ආචාර්ය ධම්මික දිසානායක | කථිකාචාර්ය<br>සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය |
| 06 | මහාචාර්ය කෝලිත භානු දිසානායක | පීඨාධිපති<br>සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය |
| 07 | ආචාර්ය රවීන්ද්‍ර රන්දෙණිය | ප්‍රවීණ රංගන ශිල්පි |
| 08 | ධම්මිත් ෆොන්සේකා මහතා | ප්‍රවීණ රංගන ශිල්පි |
| 09 | එන්. පී. ඒ. ආර්. ජයවර්ධන මහත්මිය<br>ඩබ්. ඒ. ජේ. සී. වික්‍රමාරච්චි මහත්මිය<br>ජූඩ් නිලුක්ෂාන් මහතා | භාණ්ඩාගාර නියෝජිත |
| 10 | තිලක් හෙට්ටිආරච්චි මහතා | අතිරේක ලේකම් (ප්‍රවර්ධන)<br>බුද්ධශාසන හා ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව |
| 11 | කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ මහත්මිය | ලේකම්,<br>ජාතික උරුමය, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය |
| 12 | වසන්ති චතුරාණි මහත්මිය | ප්‍රවීණ රංගන ශිල්පිනී |

2022 අගෝස්තු මස සිට චිත්‍රපට සංස්ථාව නව සභාපතිවරයෙකු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කිරීමට රේඛීය අමාත්‍යවරයා විසින් කටයුතු කර ඇත.

| | | |
|---|---|---|
| 01 | නීතිඥ දීපාල් චන්ද්‍රරත්න මහතා | සභාපති<br>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව |
| 02 | දිනිත් චින්තක කරුණාරත්න මහතා | රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්<br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව |
| 03 | නලින් කුමාර නිශ්ශංක මහතා | අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව |
| 04 | තරණි අනෝජා ගමගේ මහත්මිය | සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ<br>සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව |
| 05 | ජනාධිපති නීතිඥ ජගත් වික්‍රමනායක මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 06 | ඇෂ්ලි රත්නවිභූෂණ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 07 | නදීකා ගුණසේකර මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 08 | පී. පී. එස්. ආර්. ද සිල්වා මහතා | අධ්‍යක්ෂ<br>විදේශ සම්පත් දෙපාර්තමේන්තුව<br>භාණ්ඩාගාර නියෝජිත |

## 03. දේශීය චිත්‍රපට නිෂ්පාදනය

| | විස්තරය | ප්‍රගතිය(රු. ශත) |
|---|---|---|
| 01. | <u>**දේශිය චිත්‍රපට ලියාපදිංචි කිරිම**</u><br>**චිත්‍රපට සංඛ්‍යාව - 30**<br>(එක් චිත්‍රපටයක් වෙනුවෙන් රු. 5000.00 ක මුදලක් ලියාපදිංචි ගාස්තු වශයෙන් අය කරනු ලැබේ)<br><br>චිත්‍රපටවල නාමය වෙනස් කිරීම වෙනුවෙන් ගාස්තු **- 04**<br>(එක් චිත්‍රපටයක් සඳහා රු. 3000.00 බැගින්) | **150,000.00**<br><br><br><br>**12,000.00** |
| | | **162,000.00** |

| | | |
|---|---|---|
| 02. | චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ සංස්ථා භාරය. | |
| | • **<u>විශ්‍රාම වැටුප් ගෙවීම.</u>** (එක් අයෙකුට රු. 5,000.00 බැගින් ) | |
| | ජනවාරි - 139 දෙනෙකු සඳහා, | **695,000.00** |
| | පෙබරවාරි - 164 දෙනෙකු සඳහා, | **820,000.00** |
| | මාර්තු - 161 දෙනෙකු සඳහා, | **805,000.00** |
| | අප්‍රේල් - 161 දෙනෙකු සඳහා, | **805,000.00** |
| | මැයි - 160 දෙනෙකු සඳහා, | **800,000.00** |
| | ජුනි - 159 දෙනෙකු සඳහා, | **795,000.00** |
| | ජූලි - 157 දෙනෙකු සඳහා, | **785,000.00** |
| | අගෝස්තු - 157 දෙනෙකු සඳහා, | **785,000.00** |
| | සැප්තැම්බර් -157 දෙනෙකු සඳහා, | **785,000.00** |
| | ඔක්තෝම්බර් - 157 දෙනෙකු සඳහා, | **785,000.00** |
| | නොවැම්බර්- 157 දෙනෙකු සඳහා, | **785,000.00** |
| | දෙසැම්බර් - 156දෙනෙකු සඳහා, | **780,000.00** |
| | | **9,425,000.00** |
| 03. | සුවිශේෂී කලාකරුවන් වෙනුවෙන් : | |
| | <u>වෛද්‍යාධාර ලබා දීම.</u> | |
| | ➢ **සේනක විජේසිංහ මහතා** | **50,000.00** |
| | <u>මරණාධාර ලබාදීම.</u> | |
| | ➢ **දර්ශන් ධර්මරාජ් මහතා** | **25,000.00** |
| | | **75,000.00** |
| 04. | <u>චිත්‍රපට ආනයනය</u> | |
| | 2023වර්ෂය සඳහා චිත්‍රපට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් අයදුම්පත් නිකුත් කිරීම.<br>**(එක් අයදුම්පතක් වෙනුවෙන් රු 50,000.00 බැගින්)**<br>ඒ අනුව, 2023 වර්ෂය සඳහා ලියපදිංචි සැපයුම්කරුවන් සංඛ්‍යාව - 20 කි. | **1,000,000.00** |
| | මෙම වර්ෂය තුළ ආනයනය කරන ලද දමිළ/ඉංග්‍රිසි/හින්දි සහ වෙනත් භාෂාමය චිත්‍රපට සංඛ්‍යාව 150 කි.<br>**(එක් චිත්‍රපටයක් වෙනුවෙන් රු. 5000.00 බැගින්)** | **750,000.00** |
| | | **1,750,000.00** |
| 05. | <u>විදේශ රූගත කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.</u> | |
| | වාර්තා වැඩසටහන් - **27** | |
| | - එක් වැඩසටහනක් සඳහා රු. 25,000.00 බැගින් | **675,000.00** |
| | - විදේශ සාමාජිකයින් 91 දෙනෙකු සඳහා **(එක් අයෙකු සඳහා රු. 2000.00 බැගින් )** | **182,000.00** |
| | | **857,000.00** |
| | **විදේශ වෘතාන්ත චිත්‍රපට - 04** | |
| | - එක් වැඩසටහනක් සඳහා රු. 150,000.00 බැගින් | **600,000.00** |
| | - විදේශ සාමාජිකයින් 159 දෙනෙකු සඳහා**(එක් අයෙකු සඳහා රු. 2,000.00 බැගින්)** | **318,000.00** |
| | | **918,000.00** |
| | **කෙටි චිත්‍රපට** - 01 | |
| | - එක් වැඩසටහනක් සඳහා රු. 75,000.00 බැගින් | **75,000.00** |
| | - විදේශ සාමාජිකයින් 16ක් සඳහා**(එක් අයෙකු සඳහා රු. 2,000.00 බැගින්)** | **32,000.00** |
| | | **107,000.00** |

| | | |
|---|---|---|
| | **T.V Drama – 02** | |
| | - එක් වැඩසටහනක් සඳහා රු.75,000.00බැගින් | **150,000.00** |
| | - විදේශ සාමාජිකයින් 170 දෙනෙකු සඳහා **(එක් අයෙකු සඳහා රු. 2,000.00 බැගින්)** | **340,000.00** |
| | | **490,000.00** |
| | **Reality Show– 02** | |
| | - එක් වැඩසටහනක් සඳහා රු.75,000.00බැගින් | **150,000.00** |
| | - විදේශ සාමාජිකයින් 230 දෙනෙකු සඳහා **(එක් අයෙකු සඳහා රු. 2,000.00 බැගින්)** | **460,000.00** |
| | | **610,000.00** |
| | **TV COMMERCIAL - 02** | |
| | - එක් වැඩසටහනක් සඳහා රු. 50,000.00 බැගින් | **100,000.00** |
| | - විදේශ සාමාජිකයින් 45 දෙනෙකු සඳහා**(එක් අයෙකු සඳහා රු. 2,000.00 බැගින්)** | **90,000.00** |
| | | **190,000.00** |
| | **Photo Shoot – 02** | |
| | - එක් වැඩසටහනක් සඳහා රු. 25,000.00 බැගින් | **50,000.00** |
| | - විදේශ සාමාජිකයින් 11 දෙනෙකු සඳහා**(එක් අයෙකු සඳහා රු. 2,000.00 බැගින්)** | **22,000.00** |
| | | **72,000.00** |

**වෙනත් (විශේෂ සේවා)**

I. සිනමා ශිල්පීන් සඳහා සහ පැරණි චිත්‍රපට සඳහා අනන්‍යතාව සහතික කිරීමේ ලිපි නිකුත් කිරීම.

II. සිනමා ශිල්පීන් සඳහා හැඳුනුම්පත් ලබා දීමට කටයුතු කිරීම.

III. ශ්‍රී ලංකා රේගුව වෙත රේගු නිෂ්කාශන ලිපි නිකුත් කිරීම.

IV. දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තු වෙත සිනමාශාලා වෙනුවෙන් බදු සහන ලබාදීම සඳහා තහවුරු ලිපි නිකුත් කිරීම.

V. මෙරට රූගත කරනු ලබන දේශීය හා විදේශ චිත්‍රපට සහ අනෙකුත් වැඩසටහන් සඳහා විදේශයන් වෙතින් ආනයනය කරනු ලබන කැමරා ඇතුළු තාක්ෂණික මෙවලම් සඳහා ශ්‍රී ලංකා රේගුව වෙත ඇපකරයක් ලබා ගැනීමෙන් අනතුරුව රේගු නිෂ්කාශන ලිපි නිකුත් කිරීම.

VI. සිනමා ශිල්පීන්ගේ සුබසාධන කටයුතු සඳහා සහය ලබා දීම.

VII. සිනමාව අධ්‍යයනය කරනු ලබන විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන් වෙත සිනමා තොරතුරු ලබාදීම.

VIII. චිත්‍රපට නිෂ්පාදනය සහ චිත්‍රපට ආනයනය වෙනුවෙන් අධිකරණ කටයුතු සඳහා ජාතික චිත්‍රපට සංස්ථාව වෙනුවෙන් අවශ්‍ය තොරතුරු සමග ඉදිරිපත් කිරීම.

IX. සංස්ථා (රිත්මා) මණ්ඩලය යටතේ ප්‍රදර්ශනය සඳහා මුදාහරිනු ලබන දේශීය සහ විදේශීය චිත්‍රපට වෙනුවෙන් බෙදාහැරීමේ ගිවිසුම් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදන කිරීම.

X. මාධ්‍යවේදීන් සඳහා චිත්‍රපට නැරඹීමේ අවසරපත් ලබා දීම.

## **04.** මානව සම්පත් හා පරිපාලන කටයුතු

2022 වර්ෂයේ සංස්ථා කාර්ය මණ්ඩලය

| **2022.01.01 දිනට කාර්යමණ්ඩලය** | |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 186 |
| ස්ථිර සංඛ්‍යාව | 117 |
| | |
| **2022 වර්ෂය තුළ ඉවත් වූ සංඛ්‍යාව** | |
| විශ්‍රාම ලැබූ සේවක සංඛ්‍යාව | 01 |
| සේවයෙන් ඉල්ලා අස්වූ සේවක සංඛ්‍යාව | 03 |
| | |
| 2022.12.31 ස්ථිර කාර්යමණ්ඩලය | 113 |
| | |
| අනෙකුත් කාර්ය මණ්ඩලය | |
| සභාපති | 01 |
| | |
| 2022.12.31 මුළු කාර්ය මණ්ඩලය | 114 |

**ආයතන පාලනය හා සේවක අවශ්‍යතා ඉටුකිරීම**

ආයතනයේ සේවක පාලනයට අදාළව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයමින් සේවා කටයුතු ඉටුකර ඇත.

## **05. චිත්‍රපට ප්‍රචාරණය/ සිනේ ඇඩ්**

## **2022 වර්ෂයට අදාළව ඉටු කරන ලද කාර්යයන් හා ප්‍රගතිය**

පුවත්පත් ප්‍රචාරක කටයුතු වෙනුවෙන් ආදායම රු. 15,988.30

ප්‍රචාරක පුවරුප්‍රදර්ශන ආදායම රු. 304,500.00

රු.320,488.30

## 2022-01-01 - දිනසිට 2022-12-31 දක්වා චිත්‍රපට ප්‍රචාරක වියදම

| ගෙවන ලද ආයතනය | මුදල (රු.) |
|---|---:|
| Wijeya News Paper Ltd | 9,782.20 |
| Wijeya News Paper Ltd | 24,976.03 |
| Wijeya News Paper Ltd | 3,965.76 |
| | **38,723.99** |

## <u>2022-01-01 දින සිට 2022-12-31 දක්වා සංස්ථා දැන්වීම් සඳහා වියදම්</u>

| ගෙවන ලද ආයතනය | මුදල (රු.) |
|---|---:|
| The Associated News Papers of Ceylon Limited | 130,925.75 |
| | 105,019.20 |
| | 19,794.38 |
| | 102,989.40 |
| | **358,728.73** |

## 06. අධ්‍යාපන ප්‍රවර්ධන හා සංස්කෘතික

❖ **සිනමාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

- 2021 වර්ෂයේ පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සාර්ථකව අවසන් කර ඇත. මෙම පාඨමාලාව කොවිඩ් වසංගත තත්වය නිසා නිවැරදි කාල රාමුව තුළ අවසන් කිරීමට නොහැකි විය.
- ලාංකේය සිනමාවට වසර 75ක් සපිරෙන මොහොතේදී, ජාතික චිත්‍රපට සංස්ථාවෙන් සිනමා ඩිප්ලෝමාව ලබා ජාත්‍යන්තර සිනමා උළෙල ඇගයීමට සහ සම්මානයට පාත්‍ර වූ සිසුන් 08දෙනෙකු තෝරා සම්මාන සහ සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී.
- සිනමා පාඨමාලා සඳහා භාවිතා කිරීමට SONY A7 R iiiකැමරාවක් මිලදී ගැනීම.

❖ **සිනමා තිර රචනය සහතික පත්‍ර පාඨමාලාව - 2023 සැලසුම් කිරීම.**

- මෙම පාඨමාලාව සඳහා විශේෂ කමිටුවක් මගින් විෂය නිර්දේශ සකස් කර ඇති අතර, 2023 දෙවන කාර්තුව තුළ ආරම්භ කිරීමට නියමිතයි.



❖ **සිනමා ප්‍රකාශන නිකුත් කිරීම.**

- චිත්‍රපට සඟරාව 2022 සංවත්සර කලාපය නිකුත් කර ඇත. පිටපත් 500 ක් මුද්‍රණය කර ඇත. එයින් පිටපත් 495 ක් සමාජගත කර ඇත.(අලෙවිය සහ විශේෂ පරිත්‍යාග යටතේ)




- සිනමා ප්‍රකාශන ව්‍යාපෘතිය යටතේ සිනමා ග්‍රන්ථ දෙකක් මුද්‍රණය කර ජනගත කර ඇත.

  1. පශ්චාත් නූතන සිනමාව ග්‍රන්ථය - ප්‍රභාත් අගම්පොඩි
  2. සිංහලේ මහා සිනමා වංශය 2 - ආතර් යූ අමරසේන






❖ **සිනමා ප්‍රේක්ෂක ප්‍රවර්ධන වැඩමුළු පැවැත්වීම. (දිස්ත්‍රික් කේන්ද්‍රකර)**



1. බදුල්ල ඌව පළාත් පුස්තකාල ශ්‍රවණාගාරය - සෞන්දර්ය ගුරුවරුන් 250ක් සහභාගීත්වයෙන්. (2022.03.23)
2. බණ්ඩාරවෙල නගර ශාලාව - සෞන්දර්යය ගුරුවරුන් 250ක් සහභාගීත්වයෙන් (2022.03.24)
3. ආරක්ෂක සේවා විද්‍යාලය - කොළඹ 02, ගුරුවරුන් 400 ක සහභාගීත්වයෙන් සිනමා රසවින්දන වැඩමුළුව - බැද්දෙගම චිත්‍රපට ප්‍රදර්ශනය - 2022.11.22

❖ **සිනමා පුස්තකාලය**



සිනමා පුස්තකාලය විධිමත් ලෙස ස්ථානගත කර භාවිතයට ගත හැකි පරිදි සකස් කිරීම.

❖ **සිනමා ප්‍රකාශන අලෙවිය**

රු.306,395.00 ක ආදායමක් සහිත පොත් අලෙවියක් සිදුකර ඇත. (පොත්හල් මගින්, විවිධ බාහිර වැඩසටහන්, ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය කේන්ද්‍ර කර)





## 07. චිත්‍රපට බෙදාහැරීම්

### 1. චිත්‍රපට ප්‍රදර්ශනය

- ❖ 2022 වර්ෂය තුළදී රිත්මා මණ්ඩලය යටතේ සිනමාශාලා 42ක් ක්‍රියාත්මක විය.

### 2. චිත්‍රපට මුදාහැරීම

- ❖ සිනමාශාලා 42ක් සඳහා රිත්මා මණ්ඩලය මගින් චිත්‍රපට මුදාහැර ඇත.
- ❖ 2022 වර්ෂය තුළ රිත්මා මණ්ඩලය හා අනෙකුත් මණ්ඩල සමග ඒකාබද්ධවී චිත්‍රපට මුදාහැරීමට කටයුතු කර ඇත.
- ❖ රිත්මා මණ්ඩලය මගින් සිංහල චිත්‍රපට 05ක් මුදාහැරීමට කටයුතු කර ඇත.
- ❖ මෙම වර්ෂයේ ජනවාරි සිට සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද දමිළ චිත්‍රපට 03ක් හා හින්දි චිත්‍රපට 04ක් රිත්මා මණ්ඩලයේ හා අනෙකුත් මණ්ඩල සිනමාශාලා හා ඒකාබද්ධ වී රිත්මා මණ්ඩලය මගින් මුදාහැරීමට කටයුතු කර ඇත.
(සංස්ථා මණ්ඩලය වෙත ලබාදී ඇති කොටසින් (කෝටා) චිත්‍රපට ලබාගෙන රිත්මා මණ්ඩලය මගින් මුදාහැරීමට කටයුතු කර ඇත.)

### 3. චිත්‍රපට කුලිය

රිත්මා මණ්ඩලය විසින් අනෙකුත් මණ්ඩලවලට සපයන ලද චිත්‍රපට සඳහා ලැබී ඇති චිත්‍රපට කුලී මුදල්

- ❖ ලංකා ෆිල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (පුද්) සමාගම = රු. 215,801.12
- ❖ ඊ.ඒ.පී.ෆිල්ම්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් (පුද්) සමාගම = රු. 569,557.92
- ❖ සිනමා එන්ටර්ටේන්මන්ට් (පුද්) සමාගම = රු. 247,708.58

රිත්මා මණ්ඩලයේ සිනමා ශාලාවල අනෙකුත් මණ්ඩලවලින් ලබාගත චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි මුදල් ගෙවා ඇත.

- ❖ ලංකා ෆිල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (පුද්) සමාගම = රු. 10,421,394.46
- ❖ ඊ.ඒ.පී.ෆිල්ම්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් (පුද්) සමාගම = රු. 5,454,039.76
- ❖ සිනමා එන්ටර්ටේන්මන්ට් (පුද්) සමාගම = රු. 2,774,725.51

## 08. දේශීය සැපයුම් ආනයනය හා අපනයනය

1. E-Ticketingව්‍යාපෘතියට අදාළව ලංසු ප්‍රදානය කර ව්‍යාපෘතිය ආරම්භ කිරීම.
2. සරසවි චිත්‍රාගාරයට හා ප්‍රධාන කාර්යාලයට අදාළව ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා ලබා ගැනීම හා යාවත්කාලීන කිරීමට අදාළව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
3. සිනමාශාලා හිමියන් සහ සංස්ථාවේ අවශ්‍යතාවන් පරිදි කාර්මික උපකරණ හා කාර්යාලීය ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් උපකරණ නියමිත ක්‍රමවේදයන් යටතේ මිලට ගෙන සැපයීම.
4. සිනමා ශාලා සහ සංස්ථාවේ අවශ්‍යතාවන් අනුව මුද්‍රණ කාර්යයන්ට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
5. නියෝජිත ආයතන සමග භාණ්ඩ හා සේවාවන්ට අදාළ සේවා ගිවිසුම් යාවත්කාලීනව පවත්වාගෙන යාම.
6. වාහන අලුත්වැඩියා කිරීම හා වාහන රක්ෂණය කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.
7. සංස්ථාවේ අවශ්‍යතාවන් පරිදි කාර්මික උපකරණ හා ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.
8. සංස්ථාවේ සියලුම විකුණුම් සඳහා අදාළ විකුණුම් ඉන්වොයිස් නිකුත් කිරීම

## 9. අභ්‍යන්තර විගණන කටයුතු

1971 අංක 18 දරන පනත සහ සංශෝධිත පනතේ අරමුණු ළගාකරගැනීම සඳහා සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්මට අනුව 2022 වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන විගණකාධිපතිගේ උපදෙස් පරිදි සකස් කරන ලදී.

වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 01ක් පවත්වා ඇත. (2022/12/15)

විගණන හා කළමනාකරණකමිටු සාමාජිකයින්

| නම | තනතුර |
|---|---|
| පී.පී.එස්.ආර්. ද සිල්වා මහතා | කමිටු සභාපති (භාණ්ඩාගාර නියෝජිත ) |
| නලින් කුමාර නිශ්ශංක මහතා | කමිටු සාමාජික |
| නදීකා ගුණසේකර මහත්මිය | කමිටු සාමාජික |
| එම්.කේ. ජයසේකර මහතා | විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය |
| නිමාලි ජයසිංහ මහත්මිය | ප්‍රධාන අභ්‍යන්තර විගණක -ජනමාධ්‍ය අමාත්‍යාංශය |

## 10. මූල්‍ය කටයුතු

### 01. <u>ආදායම් ප්‍රභව</u>

2021 - 2022 යන වර්ෂවල සත්‍ය ආදායම හා 2022 වර්ෂයේ අයවැයගත ආදායමපිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම | **2021 සත්‍ය රු.මි.** | **2022 සත්‍ය රු.මි.** | **අඩුවීම / වැඩිවීම (%)** | **2022 අයවැය රු.මි.** |
|---|---|---|---|---|
| බෙදාහැරීමේ කොමිස් - දේශීය | 1.8 | 8.3 | 361.1 | 20 |
| විදේශීය | 12 | 38.6 | 221.6 | |
| වැඩිවීම (සංස්ථාභාරය) | 2.1 | 6.6 | 214.3 | 4.5 |
| අධිභාර පරීක්ෂණ දඩ මුදල් හා වෙනත් | 1.1 | 1.5 | 36.4 | 1.3 |
| සිනේඇඩ්ස් කොමිස් | 0.1 | 0.01 | (90.0) | 0.5 |
| චිත්‍රාගාරයේ ආදායම | 0.5 | 2.5 | 400.0 | 2.5 |
| වෙළඳ කටයුතු | 0.7 | 1.8 | 157.1 | 1.1 |
| **මෙහෙයුම් ආදායම්** | **18.3** | **59.3** | **224.1** | **29.9** |
| **වෙනත් ආදායම්** | **48.7** | **91.9** | **88.7** | **75.1** |
| **භාණ්ඩාගාරයෙන් -ජනාධිපති සම්මාන උළෙල සඳහා** | **0** | **0** | **0** | **0** |
| **පුනරාවර්තන වියදම් සඳහා ලැබීම්** | **100** | **97.4** | **(2.6)** | **97.5** |
| **මුළු ලැබීම්** | **167** | **248.6** | **48.9** | **202.5** |

2021ට සාපේක්ෂව සලකා බැලීමේදී මෙහෙයුම් ආදායම 2022දී 2021ට වඩා224.1% කින් වැඩි වීමක් පෙන්වා ඇත.දේශීය බෙදාහැරීමේ කොමිස් 361.1% කින් ද විදේශීය බෙදාහැරීමේ කොමිස් 221.6%කින්ද වැඩිවීම මෙහෙයුම් ආදායම වැඩිවීමට ප්‍රධාන හේතුව වේ.

**02. <u>වියදම් ප්‍රභවය</u>**

2021,2022 යන වර්ෂයන්හි සත්‍ය වියදම සහ 2022 වර්ෂයේ අයවැයගත වියදමපිළිබඳතොරතුරු පහත දැක්වේ.

| වියදම | 2021 සත්‍ය රු.මි. | 2022 සත්‍ය රු.මි. | අඩුවීම / වැඩි වීම (%) | 2022 අයවැය රු.මි. |
|---|---|---|---|---|
| සේවක පාරිශ්‍රමික | 89.5 | 88.8 | (0.8) | 97.5 |
| ගමන් හා යැපීම් දීමනා | 0.4 | 0.4 | 0.0 | 0.3 |
| සැපයුම් හා උපකරණ | 5.6 | 2.8 | (50.0) | 8.4 |
| අලුත්වැඩියා කිරීම් හා නඩත්තු | 25.3 | 4.7 | 25.7 | 4.7 |
| ක්ෂයවීම් | | 27.1 | | |
| ජාතික චිත්‍රපට උත්සව | 0 | 35 | 0.0 | 0 |
| විකුණුම් පිරිවැය | 0.7 | 1.2 | 71.4 | 3.3 |
| ප්‍රවාහන සම්බන්ධතා,අවශ්‍යතා වෙනත් | 21.6 | 28.6 | 32.4 | 63.8 |
| බොල් ණය වෙන් කිරීම් | 1.6 | 19.4 | 1112.5 | 17.3 |
| පාරිතෝෂික වෙන් කිරීම | 2.4 | 2 | (16.7) | 5.3 |
| චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල | 10.5 | 8 | (23.8) | 0.5 |
| **මුළු වියදම** | **157.6** | **218** | **38.3** | **201.1** |

2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ දී වියදම 38.3% කින් වැඩි වීඇත. එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, 2022 වර්ෂයේ ජනාධිපති සම්මාන උළෙල සඳහා මිලියන 35 ක් සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම මිලියන 19.4 ක් දක්වා වැඩිවීමය.

| | 2021<br>රු.මි. | 2022<br>රු.මි. | % |
|---|---|---|---|
| මෙහෙයුම් ආදායම | 18.3 | 59.3 | 224.1 |
| **අඩුකළා** | | | |
| මෙහෙයුම් වියදම | (157.6) | (218) | 38.3 |
| මෙහෙයුම් ලාභය / අලාභය | (139.3) | (158.7) | 13.9 |
| **එකතුකළා** | | | |
| වෙනත් ආදායම් | 48.7 | 91.9 | 88.7 |
| වර්ෂයේ ලාභය / අලාභය | (90.6) | (66.8) | (26.3) |
| **එකතුකළා** | | | |
| භාණ්ඩාගාරයෙන් - ජනාධිපති සම්මාන උළෙල සඳහා | - | - | - |
| පුනරාවර්තන වියදම් සඳහා | 100 | 97.4 | (2.6) |
| **අතිරික්තය** | 9.4 | 30.6 | 225.5 |

2021ට සාපේක්ෂව 2022 වර්ෂයේදී මෙහෙයුම් අලාභය 26.3% කින් අඩු වී ඇත. භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන වියදම් සඳහා ලැබීම් ගැළපීමෙන් පසු 225.5% අතිරික්තයක් පෙන්වා ඇත.

**ස්ථාවර වත්කම්**

2022 වර්ෂයේදී සරසවි චිත්‍රාගාරය සඳහා ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු. 205,900.00ක මුදලක් ද,E- Ticketingමෘදුකාංග පද්ධතිය සඳහා රු. මි. 3.3ක මුදලක් ද වැය කර ඇත. 2020 වර්ෂයේදී චිත්‍රපට කුලී සංස්ථාභාරය (රිත්මා) පරිගණක වැඩසටහන් පද්ධතියෙහි ඩොස් මූලික පද්ධතිය වින්ඩෝස් බවට පත්කිරීම සඳහා වැය කළ මුදල 2022 වර්ෂයේ දී වත්කමක් ලෙස හඳුනාගෙන ඇති අතරළ සඳහා 2021 වර්ෂයේදී රු. 215,000.00 ක් ද 2022 වර්ෂයේදී රු. 107,500.00 ක් වැය කර ඇත. තවද 2022 වර්ෂයේදී මෝටර් රථ ප්‍රත්‍යාගණනයක් ද සිදු කරන ලදි.

**ජංගම වත්කම්**

පසුගිය වර්ෂයට සාපේක්ෂව සලකා බලන විට ජංගම වත්කම් රු.මි.232කින් වැඩි වී ඇත.

**ජංගම වගකීම්**

2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී චිත්‍රපට කුලී ණයහිමියන් වැඩිවීම හේතුවෙන් රු.මි.126.5කින් ජංගම වගකීම් වැඩි වී ඇත.

## 11. නීති අංශය

**2022 වර්ෂය තුළ නීති අංශය මගින් සිදු වී ඇති කාර්ය භාරය**

- සංස්ථාව පාර්ශවයක් වන නඩු සම්බන්ධයෙන් සංස්ථාව වෙනුවෙන් පෙරකලාසි ගොනු කිරීම හා අදාළ අධිකරණයේ සංස්ථාව වෙනුවෙන් පෙනීසිටීම.
- කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරියේ කාර්මික ආරවුල් සඳහා සංස්ථාව වෙනුවෙන් පෙනීසිටීම.
- දේශීය චිත්‍රපට නිෂ්පාදනය හා බෙදාහැරීම, ආනයනය කරනු ලබන චිත්‍රපට බෙදාහැරීම සම්බන්ධයෙන් සහ චිත්‍රපට නිෂ්පාදනය/ චිත්‍රාගාර සේවා/ පිටපත් මුද්‍රණය/සිනමාශාලා සඳහා ණය මුදල් ලබා දීම සහ සේවා සැපයීම ඇතුළු සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.
- ජාතික චිත්‍රපට සංස්ථාවට උපකාරක සේවා ලබාගැනීම සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.
- එදිනෙදා අවශ්‍යතාව පරිදි සංස්ථාවේ ඕනෑම අංශයකින් යොමු කරන නීතිමය ගැටලු සඳහා උපදෙස් ලබා දීම.

## 12. චිත්‍රාගාර සේවා සැපයීම

පශ්චාත් නිෂ්පාදන අදියරේ පවතින චිත්‍රපට සඳහා කාර්මික සේවා සහ පහසුකම් සැපයීම දළුගම සරසවි චිත්‍රාගාරයේ ප්‍රධාන කාර්යභාරය වේ.

මෙම වසරේදීත් චිත්‍රාගාරයේ පහත සඳහන් අංශවලින් දේශීය චිත්‍රපට නිෂ්පාදකවරුන්ට අවශ්‍ය කාර්මික සේවා සහ පහසුකම් සපයා ඇත.

1. ශබ්ද අංශය (Digital)
2. ආරේඛීය සංරක්ෂණ අංශය(Digital)
3. සංරක්ෂණ අංශය(Analogue)
4. පශ්චාත් නිෂ්පාදන උපකරණ සංරක්ෂණාගාරය
5. චිත්‍රපට සංරක්ෂණාගාරය
6. චිත්‍රපට හා රූපවාහිනී රූගත කිරීමේ මැදිරිය

| | | | |
|---|---|---|---|
| ශබ්ද අංශය | - | චිත්‍රපට ගණන 20 | ආදායම රු. 1,785,568.25 |
| සංස්කරණ අංශය | - | චිත්‍රපට ගණන 05 | ආදායම රු. 280,025.00 |
| රූගත කිරීම | - | චිත්‍රපට ගණන 12 | ආදායම රු. 639,518.07 |
| | | | ආදායම රු. **2,705,111.32** |

**සංරක්ෂණාගාරය**

පැරණි සංරක්ෂණාගාරයේ තැන්පත් කර ඇති චිත්‍රපට රීල් පවිත්‍ර කිරීමේ කටයුතු සිදුකෙරේ.

2022 වසරේ සංරක්ෂණ කටයුතු සඳහා තෝරාගෙන ඇති අසම්පූර්ණ චිත්‍රපට 25ක පමණ රීල් 25ක් රසායනික ද්‍රව්‍ය දමා පිරිසිදුකර නව ප්ලාස්ටික් බහාලුම්වල දමා සංරක්ෂණාගාරයේ තැන්පත් කර ඇත.

Cine Post Archive කෞතුකාගාරයේ යාවත්කාලීන කටයුතු සිදුකර ඇත.

**අනෙකුත් කාර්යයන්**



1.2022 ජනවාරි 21 දිනට යෙදී තිබූ ශ්‍රී ලාංකේය සිනමාවේ 75 වන සහ ජාතික චිත්‍රපට සංස්ථාවේ 50 වන සංවත්සර උත්සවයට සමගාමීව සරසවි චිත්‍රාගාරයේ කලු සුදු රසායනාගාර පරිශ්‍රයේ Cine Post Archive නමින් පැරණි සිනමා කෞතුක භාණ්ඩ රැසක් ස්ථානගත කර කෞතුකාගාරයක් ආරම්භ කරන ලදි.



2.චිත්‍රාගාරයේ වේශ නිරූපණ මැදිරිය පෙර වසරේ සකස් කරන ලද සැලැස්මට හා ඇස්තමේන්තුව පරිදි ඉදිකිරීම් කොටස පමණක් සිදුකර අවසන් කර ඇත.

3.චිත්‍රාගාරයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ උඩුමහලේ කාර්යාල අංශ දෙකකට බෙදා වෙන්කිරීමේ කාර්යය සිදුකර ඇත.

4.සංරක්ෂණ අංශය බෙදා වෙන්කර ඉදිකිරීමේ කාර්ය අවසන් කර ඇත.



5.චිත්‍රාගාරයේ කාර්ය මණ්ඩලයේ ශ්‍රම දායකත්වයෙන් නවීකරණය කර සකස් කරන ලද දෙබස් හා Folly sound පටිගත කිරීමේ මැදිරිය විවෘත කිරීම සිදුකරන ලදි.

## 13. විමර්ශන කටයුතු

**2022 වර්ෂය තුළ විමර්ශන අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්**

1. සිනමාශාලා පරික්ෂා කිරීම හා අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම.
2. සිනමාශාලා ඉදිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස් කිරීම.
3. නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.
4. විදේශ රූ ගත කිරීම් අධීක්ෂණය.
5. සිනමාශාලා සඳහා මත්පැන් බලපත්‍ර ලබාගැනීම සඳහා නිෂ්කාශන ලිපි නිකුත් කිරීම.
6. 2022.09.27 දින පත්කරන ලද කමිටුව මගින් පවරන ලද සිනමාශාලාවලින් අය විය යුතු පැරණි හිඟ මුදල් අය කරගැනිම.
7. සිනමාශාලාවල තත්ත්වය සොයා බලා ප්‍රවේශපත්‍ර ගාස්තු සංශෝධනය සඳහා නිර්දේශ ලබාදීම.

01. සිනමාශාලා පරික්ෂා කිරීම හා අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම.

01-(අ) සිනමාශාලා පරීක්ෂා කිරීම

පරික්ෂණ අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ සිනමාශාලා පරික්ෂා කිරීමයි.2022වර්ෂයේ පරික්ෂණ වාර 705 කී.

(ආ) සිනමාශාලාවල සිදුවන අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම.

විමර්ශන නිලධාරින් විසින් සිනමාශාලා පරික්ෂා කිරිමේ දි අක්‍රමිකතා හඳුනාගෙන ඇත. ඒ සඳහා සංස්ථා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමින් 2022 වර්ෂය රු.119,800.00 වටිනාකමකින් යුක්ත හරපත්‍ර 24ක් නිකුත් කර ඇත. ඉන් රු. 81,500.00ක මුදලක් අයකරගෙන ඇත.

02. සිනමාශාලා ඉදිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස් කිරීම.

සිනමාශාලා ඉදිකිරීම සම්බන්ධ තොරතුරු රැස් කිරීම සඳහා සියලුම පළාත් පාලන ආයතන හා ප්‍රාදේශීයසභා සඳහා සිනමාශාලා ඉදිකිරීම සම්බන්ධ තොරතුරු විමසා ලිපි යොමුකරන ලදි. අදාළ ලිපියට අනුව පළාත් පාලන ආයතනවලින්, විවිධ තොරතුරු සිනමාශාලාවන් ඉදිකිරීම සඳහා ඉදිරිපත් කර තිබුණි.ඒ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**ඉදිවෙමින් පවතින සිනමාශාලා**

ඒ අනුව විමර්ශන අංශය මැදිහත්ව මේ වන විට සිනමාශාලාවක් ඉදිවෙමින් පවතින අතර වසා දමා තිබූ සිනමාශාලාවක් විවෘත කිරීමද 2022 වසර තුළ සිදුවිය.

**මිනුවන්ගොඩ යෝජිත සිනමාශාලාව**

මෙම සිනමා ශාලා සංකීර්ණය මිනුවන්ගොඩ නගරයේ ගල්ඔළුව ප්‍රදේශයේ මහල් තුනකින් සමන්විත වන, ගොඩනැගිල්ලේ තුන්වන මහලේ ඉදිවෙමින් පවතී. 2022 වර්ෂය අවසාන වන විට 75% ක පමණ දුරට වැඩ කටයුතු සම්පූර්ණ කර ඇත.

දැනට මෙම ගොඩනැගිල්ලේ වහලය සකස් කිරීමේ කටයුතු කරගෙන යන අතර සිනමාශාලාවට අවශ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය සහ ශබ්ද පද්ධතිය සඳහා අදාළ ඇස්තමේන්තු සකස් කරමින් පවතී. මෙම උපකරණ ඉන්දියාවෙන් ආනයනය කිරීමේ මූලික සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී.



03. නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.

වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම

**සංසකාවි - පේසාලේ**

මෙම සිනමාශාලාව පේසාල් නගරයේ පවත්වාගෙන යනු ලැබේ. එවකට තිබූ පවුලික් සිනමාශාලාව (2001 වසර) සංසකාවි නමින් නම වෙනස් කරමින් එම ස්ථානය සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කර නව කළමනාකාරීත්වයක් යටතේ 2022 වර්ෂයේ අගෝස්තු මස නැවත විවෘත කරනු ලැබීය.

මන්නාරම් දිස්ත්‍රිකයේ සිට 18km පමණ තලෙයිමන්නාරම් නගරයට ආසන්නව පිහිටා ඇත.









04. විදේශ රූ ගත කිරීම් අධික්ෂණය

විදේශ රටවලින් ශ්‍රී ලංකාවට පැමිණෙන වෙළඳ දැන්වීම්, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් රූ ගත කිරීම් අධීක්ෂණ කටයුතු සිදු කරන ලදී. ඒ අනුව 2022 වර්ෂයේ විදේශ රූගත කිරීම් වාර 40ක් අධීක්ෂණය කර ඇත.

05.සිනමාශාලා සඳහා මත්පැන් බලපත්‍ර ලබාගැනීම සඳහා නිෂ්කාශන ලිපි 23ක් නිකුත් කිරීම.

06.සිනමාශාලාවලින් අයවිය යුතු පැරණි හිග මුදල් අයකර ගැනිම

2022.09.27 දිනට සිනමාශාලාවලින් අයවිය යුතු පැරණි හිග මුදල් අයකරගැනිම සඳහා විමර්ශන අංශයේ පත්කරන ලද කමිටුව මගින් අයකරගන්නා ලද හිඟ මුදලරු. 5,652,085.73කි.

## 14. සැලසුම්, සංඛ්‍යාලේඛන හා පුහුණු

**මෙම අංශයේ ප්‍රමුඛ කාර්යභාරය පහත පරිදි වේ.**

- ආයතනික සැලසුම් සකස් කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයීම.
- සංයුක්ත සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම හා ප්‍රගතිය අධීක්ෂණය
- වාර්ෂික වාර්තා පිළියෙළ කිරීම
- මාසික සහ කාර්තුමය ප්‍රගතිය රේඛීය අමාත්‍යාංශය සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- කාර්යමණ්ඩල පුහුණු අවශ්‍යතාවන් හඳුනාගැනීම හා වාර්ෂික පුහුණු සැලසුම් සකස් කිරීම.
- සංස්ථාවට අයත් ගැසට් චක්‍රලේඛ හා වෙනත් සංඛ්‍යාත්මක දත්ත ආදිය එක්රැස්කර පරිගණක දත්ත පද්ධතියක් පවත්වා ගැනීම.

## 15. වෛද්‍ය සහනාධාර ක්‍රමය

සාමාජික මුදල් හා සංස්ථාවෙන් ප්‍රදානය කරනු ලබන මුදල් මත පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සහනාධාර ක්‍රමය මෙම වර්ෂය තුළ ද ක්‍රියාත්මක වූ අතර එහි පාලක කමිටුව පහත පරිදි වේ.

- ගයනි මුණවීර මහත්මිය - වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් (කමිටු සභාපති) 2022.04.29 දින දක්වා
- දුනිල් හෙයියන්තුඩුව මහතා -වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් (කමිටු සභාපති) 2022.10.26 දින සිට
- අසංක ගුණතිලක මහතා - පරිපාලන නිලධාරි - පාලන හා මානව සම්පත්
- කේ. ආර්. වින්සන් මහතා - කමිටු සාමාජික
- සුචිත ඉලංගකෝන් මහතා - කමිටු සාමාජික

## 16. සුභසාධක සංගමය

සංස්ථා සුභසාධක සංගමය විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉටුකර ඇති සේවක සුබසාධන කටයුතු පිළිබඳවූ වාර්තාව පහත පරිදි වේ.

- 2022.11.10 දින සංගමයේ මහා සභාවක් පවත්වා නව නිලධාරී මණ්ඩලයක් පත්කර ගැනීම.
- මෙතෙක් පැවති සාමාජික මරණාධාර දීමනාව 25,000 සිට 100,000 දක්වා වැඩිකිරීම.
- සාමාජික යැපෙන්නෙකුගේ මරණාධාර දීමනාව 25,000 සිට 50,000 දක්වා වැඩිකිරීම.
- වසර 07කට පසු සංස්ථා ආපනශාලාව විවෘත කිරීම.
- සාමාජික ණය ලබාගැනීම වෙනුවෙන් වූ සංකීර්ණ ණය අයදුම්පත්‍රය සරල කිරීම සහ වසර 15ක සේවා කාලයක් සහිත වූ සේවකයින්ගේ ණය සඳහා ඇප අහෝසි කිරීම.
- සම්පූර්ණ මරණාධාර දීමනාව ලබාගැනීමට තිබූ බාධාවන් ඉවත් කිරීම.
- ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමග එක්ව සංස්ථාව ඉදිරිපිට ATM යන්ත්‍රයක් සවිකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යාම.
- මිල්කෝ කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි සැලක් සංස්ථාව ඉදිරිපිට ආරම්භ කිරීමට කටයුතු කිරීම.

## 17. බෞද්ධ සංගමය

2022 වර්ෂයේ දී බෞද්ධ සංගමය විසින් පහත කාර්යයන් ඉටුකරන ලදි.

- ජාතික චිත්‍රපට සංස්ථාවට වසර 50 සැපිරීම නිමිත්තෙන් සංස්ථාවේ 50 වන සංවත්සරයට සමගාමීව කාර්ය මණ්ඩලයට සහ චිත්‍රපට කර්මාන්තයට සම්බන්ධ සියලුදෙනාට ආශීර්වාද කිරීම සඳහා පිරිත් පිංකමක් සිදුකරන ලදි.
- සංස්ථා සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාපනය ලබන දූදරුවන් සඳහා අවශය පොත්පත් ලබාදීම
- 2022.01.01 දින සංස්ථා සේවක මහත්ම මහත්මීන් සඳහා ආශිර්වාද බෝධි පූජා පිංකමක් සිදුකිරීම.

## 18. ක්‍රීඩා සංගමය

මේ වසර තුළ ද ක්‍රීඩා සංගමය ක්‍රියාත්මක අතර කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත ක්‍රියාකාරකම්වල නිරතවීම බාධාවන්ට ලක්ව ඇත.

## 19. වෘත්තීය සමිති

ජාතික සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, චිත්‍රපට සංස්ථා සේවක සංගමය හා වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලීසේවක සංගමය මෙම වසර තුළදී ද පාලන අධිකාරිය සමග සහයෝගයෙන් කටයුතු කර ඇත.

## 20. ස්තූතිය

2022 වසරේ සාර්ථක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සංස්ථා කාර්යමණ්ඩලය ඉතා වගකීමෙන් හා ධෛර්යයෙන් යුතුව සිය සේවාවන් ඉටුකර ඇත.

එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉමහත් සේ අගය කරන අතර ඔවුන් වෙත සිය ස්තූතිය කෘතවේදීව පළකර සිටිමි.



ජී. ඒ. කිත්සිරි
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

අත්සන් කළේ - නිතීඥ දීපාල් චන්ද්‍රරත්න
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# මූල්‍ය ප්‍රකාශන

# 2022

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2022.12.31 දිනට අවසන් වර්ෂය සඳහා**

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

| විස්තරය | සටහන | | 2022 රු. | 2021 රු. |
|---|---|---|---|---|
| විකුණුම් | **03** | | 59,383,861 | 18,380,381 |
| අඩු කළා : විකුණුම් පිරිවැය | **04** | | (1,158,212) | (689,481) |
| දළ ලාභය | | | 58,225,649 | 17,690,900 |
| අඩු කළා : වියදම් | | | | |
| සේවක පාරිශ්‍රමික | **05** | | (88,750,498) | (89,509,572) |
| ගමන් හා යැපීම් දීමනා | **06** | | (427,865) | (428,361) |
| සැපයුම් හා උපකරණ | **07** | | (2,843,434.89) | (5,637,331) |
| අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම් | **08** | | (4,726,876) | (25,275,202) |
| ක්ෂයවීම් | **08A** | | (27,141,801) | - |
| ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | **09** | | (28,642,201) | (21,555,276) |
| ජනාධිපති සිනමා උළෙල සඳහා වෙන්කිරීම් | **09A** | | (35,000,000) | - |
| අඩමාණ ණය වෙන්කිරීම් | **16-A** | | (19,414,395) | (1,627,943) |
| පාරිතෝෂික වෙන් කිරීම් | **20** | | (2,009,657) | (2,443,174) |
| චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා දායකත්වය | | | (8,000,000) | (10,500,000) |
| | | | (216,956,727) | (156,976,860) |
| මෙහෙයුම් ලාභය / අලාභය | | | (158,731,078) | (139,285,960) |
| එකතු කළා : | | | | |
| වෙනත් ආදායම් | **10** | 7,641,644 | | |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල් පොළී | | 54,115,725 | | |
| භාණ්ඩාගාර ලැබීම් ආදායමට හඳුනා ගැනීම් | | 15,713,792 | | |
| 224 ගොඩනැගිලි කුලී | | 8,839,000 | | |
| චිත්‍රාගාරයේ පිටස්තර රූගත කිරීම් | | 2,358,518 | | |
| විදේශීය වාර්තාමය චිත්‍රපට සඳහා අනුමැතිය | | 3,256,000 | | |
| | | | 91,924,679 | 48,703,513 |
| වසරේ ලාභය /අලාභය | | | (66,806,399) | (90,582,447) |
| එකතු කළා : භාණ්ඩාගාර ලැබීම් | | | 97,495,000 | 100,000,000 |
| බදු පෙර ලාභය | | | 30,688,601 | 9,417,553 |
| අඩු කළා : බදු සඳහා වෙන් කිරීම් | | | | |
| ඌනතාවය / අතිරික්තය | | . | 30,688,601 | 9,417,553 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2022 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන | 2022 | 2021 |
|---|---|---|---|
| **නියෝජනය වත්කම්** | | රු. | රු. |
| **ස්ථාවර වත්කම්** | | | |
| දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 11 | 366,257,801 | 341,996,821 |
| අස්පෘශ්‍ය වත්කම් :ක්ෂය අඩු කල පසු* | 11A | 1,194,230 | 1,691,620 |
| දිගු කාලීන ආයෝජන | 12 | 141,814,000 | 196,022,798 |
| සේවක ණය | 16-1 | 17,804,373 | 16,506,775 |
| | | 527,070,404 | 556,218,013 |
| **ජංගම වත්කම්** | | | |
| කෙටි කාලීන ආයෝජන (මාස 06 සඳහා) | 13 | 82,619,991 | 106,850,577 |
| තොග | 14 | 7,181,945 | 7,535,416 |
| ලැබිය යුතු සිනමාහල් ණය | 15A | 126,592,045 | 118,441,907 |
| නිෂ්පාදන ණය | 15B | 10,477,259 | |
| විවිධ ණයගැතියෝ | 16 | 258,758,538 | 191,404,901 |
| තැන්පතු හා ඉදිරි ගෙවීම් | 17 | 4,499,160 | 3,359,152 |
| මුදල්, බැංකු ශේෂය හා මාස 03 සඳහා කෙටිකාලීන ආයෝජන | 18 | 230,681,670 | 57,523,462 |
| | | 720,810,609 | 485,115,415 |
| **මුළු වත්කම්** | | 1,247,881,012 | 1,041,333,428 |
| **යෙදවූ ප්‍රාග්ධනය** | | | |
| අනුදත් ප්‍රාග්ධනය (පිටු අංක - 03) | | 10,000,000 | 10,000,000 |
| සමුච්චිත ලාභය (පිටු අංක - 03) | | 475,908,546 | 441,170,247 |
| සංචිත (පිටු අංක - 03) | | 160,732,759 | 134,282,759 |
| | | 646,641,305 | 585,453,006 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදානයන් | 19 | 112,617,553 | 89,894,345 |
| පාරිතෝෂික වෙන් කිරීම් | 20-1 | 44,214,794 | 48,057,987 |
| | | 156,832,346 | 137,952,331 |
| **එකතු කළා : ජංගම වගකීම්** | | | |
| පාරිතෝෂික වෙන් කිරීම් (ඉදිරි වර්ෂය සඳහා) | 20-2 | 4,719,990 | 944,610 |
| තැන්පතු | 21 | 3,049,499 | 3,039,499 |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | 22 | 312,234,007 | 244,990,974 |
| මූල්‍ය වගකීම් | 23 | 44,917,713 | 53,565,690 |
| වෙනත් ණයහිමියෝ | 24 | 77,095,287 | 13,018,453 |
| ගෙවිය යුතු බදු මුදල් | 24 | 190,865 | 190,865 |
| විගණන ගාස්තු වෙන් කිරීම් | 24 | 2,200,000 | 2,178,000 |
| | | 444,407,361 | 317,928,091 |
| **මුළු වගකීම්** | | 1,247,881,012 | 1,041,333,428 |

පිටු අංක 05 සිට 24 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 25 සිට 39 දක්වා ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය කොටසකි. මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් කර ඇත.

| | | |
|---|---|---|
| ............................ | ............................ | ............................ |
| ප්‍රදීප් ලංකා ධර්මවික්‍රම | පී.එම්. දීපාල් චන්ද්‍රරත්න | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - මුදල් | සභාපති | අධ්‍යක්ෂ |

~~2023.03.16~~
2023 . 04 . 21

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
303 , බෞද්ධාලෝක මාවත
කොළඹ 07.

නීතිඥ පී. එම්. දීපාල් චන්ද්‍රරත්න
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
303, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | හිමිකම් ප්‍රාග්ධනය | සමුච්චිත ලාභය | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | වෙනත් සංචිත | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **2021.01.01 දිනට ශේෂය** | 10,000,000 | 431,752,693 | 499,898 | 125,953,399 | 7,829,462 | 576,035,453 |
| වසරේ ලාභය | - | 9,417,553 | - | - | - | 9,417,553 |
| පසුගිය වසරට ගැලපීම් (සටහන 2.15) | | 4,049,699 | | | | 4,049,699 |
| **2021.12.31 දිනට ශේෂය** | 10,000,000 | 445,219,946 | 499,898 | 125,953,399 | 7,829,462 | 589,502,705 |
| මෝටර් රථ ප්‍රත්‍යාගණනය | - | - | - | 26,450,000 | - | 26,450,000 |
| වසරේ ලාභය | - | 30,688,601 | - | - | - | 30,688,601 |
| **2022.12.31 දිනට ශේෂය** | **10,000,000** | **475,908,546** | **499,898** | **152,403,399** | **7,829,462** | **646,641,305** |

**සංචිත**

| | |
|---|---|
| ප්‍රාග්ධන සංචිත | 499,898 |
| ප්‍රත්‍යාගණන සංචිත | 152,403,399 |
| වෙනත් සංචිත | 7,829,462 |
| | **160,732,759** |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | | 2022 | 2021 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | | රු. | රු. |
| බදු අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය | | (66,806,399) | (90,582,447) |
| (අඩු කළා ) | | | |
| නිෂ්පාදන ණය මත පොලිය | | (50,833) | - |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොලිය | | (54,115,725) | (17,388,383) |
| | | (120,972,957) | (107,970,829) |
| **මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයයන් සඳහා ගැලපීම** | | | |
| ක්ෂයවීම් | | 27,141,801 | 18,510,514 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 2,669,937 | 667,863 |
| රාජ්‍ය ප්‍රදානයන් ආදායමට හඳුනා ගැනීම | | (15,713,792) | (11,757,590) |
| අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන | | 19,414,395 | - |
| මෝටර් රථ ප්‍රදානයන් | | 13,600,000 | - |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය | | 26,450,000 | - |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ ගැලපීම් | | 6 | - |
| | | (47,410,610) | (100,550,042) |
| **ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන්** | | | |
| ඉකුත් කාල පරිච්ඡේද වල ස්ථාවර වත්කම් සඳහා ගැලපීම | | 20,084,455 | 9,919,744 |
| ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන් සඳහා ගැලපීම | | 4,049,699 | 7,269,407 |
| කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය | | (23,276,455) | (83,360,891) |
| **කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම්** | | | |
| තොගය ( අඩුවීම ) | | 353,470 | (451,021) |
| ණයගැතියෝ ( වැඩිවීම ) | | (18,627,396) | (7,032,825) |
| තැන්පතු හා ඉදිරි ගෙවීම් ( වැඩිවීම ) | | (89,205,638) | (18,935,816) |
| තැන්පතු වගකීම ( වැඩිවීම ) | | 10,000 | 90,000 |
| ණයහිමියෝ ( වැඩිවීම ) | | 67,243,034 | 11,148,940 |
| වෙනත් ණයහිමියෝ ( වැඩිවීම ) | | 55,450,857 | (2,891,533) |
| | | (8,052,130) | (101,433,145) |
| **අඩු කළා :** | | | |
| පාරිතෝෂික ගෙවීම් | | (2,737,750) | (3,000,900) |
| | | (10,789,880) | (104,434,045) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| නිෂ්පාදන ණය පොලී | | 50,833 | - |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොලිය | | 54,115,725 | 17,388,383 |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | | (70,989,853) | (36,899,452) |
| භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ආයෝජනය | | 78,439,384 | (74,261,174) |
| | | 50,826,209 | (198,206,288) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| භාණ්ඩාගාර ලැබීම් | | 122,332,000 | 110,984,000 |
| මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශුද්ධ වැඩිවීම් (අඩුවීම) | | 173,158,209 | (87,222,288) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | | 57,523,462 | 144,745,749 |
| මාස 03ට කල් පිරෙන රිපෝ / භාණ්ඩාගාර බිල්පත් | 169,156,793 | | |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | 61,524,878 | | |
| | | 230,681,670 | 57,523,462 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය**

## මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

සංස්ථාවේ කළමනාකරණය,

1. සංස්ථාවේ ආදායම සහ වියදම වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළු මූල්‍ය ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීම පිළිබඳව,

2. සංස්ථාවේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරීමක් සඳහා, 1995 අංක. 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම පිළිබඳව හා

3. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට හා වංචා සහ විෂමතා වැලැක්වීම සඳහා උචිත පියවර ගැනීම පිළිබඳව වගකිව යුතු වන්නේය.

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය**

---

## 1. පොදු තොරතුරු

### 1.1.1 පිහිටීම හා නීතිමය තත්ත්වය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව 1971 අංක.47 දරන පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කොට පිහිටුවන ලදී. එහි ලියාපදිංචි කාර්යාලය , කොළඹ 07 , බෞද්ධාලෝක මාවතේ අංක.303 දරන ස්ථානයෙහි පිහිටියේය.

### 1.1.2 මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වරූපය

ශ්‍රී ලාංකේය සිනමාවේ දේශීය අනන්‍යතාව ජාත්‍යන්තරයේ සනිටුහන් කල හැකි ගුණාත්මක සිනමා සංස්කෘතියක් ඇති කිරිමේ පුරෝගාමියා බවට පත්ව සිටී.

### 1.1.3 නිකුත් කිරීම සදහා අනුමත කළ දිනය

මෙම මූල්‍ය ප්‍රකාශනයන් බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.05.31 දින අනුමැතිය දෙන ලදී.

### 1.2 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

### 1.2.1 අනුකූලතාව පිළිබද ප්‍රකාශය

සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහිත සටහන් ( මූල්‍ය ප්‍රකාශන ) සකස් කරන ලද්දේ, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය මගින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) නියෝජනය වන පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූල වන පරිද්දෙනි.

### 1.2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබද වගකීම

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ කළමනාකරීත්වය විසින් දරනු ලැබේ.

**1.2.3 ගිණුම්කරණ පදනම**

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් උචිත හෙළිදරව් කිරීමක් කර ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කොට සකස් කර ඇත.

**1.2.4 අඛණ්ඩතාව**

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකරණය විසින් සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇත. සංස්ථාව , එහි මෙහෙයුම් පෙනෙන අනාගත කාලය තුළදී පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් සම්පත් තිබෙන බව විශ්වාසනීයව අපේක්ෂා කරයි. තිබෙන්නා වූ සියලු තොරතුරු සැලකිල්ලට ගත් විට ඉදිරියේදී සංස්ථාව ඇවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට හේතුවක් නොපෙනෙන අතර , අඛණ්ඩව පවත්නා ආයතනයක් සේ සලකා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

**1.2.5 ක්‍රියාත්මක වීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්**

සංස්ථාවේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

**1.2.6 වැදගත් වන ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපලේඛන**

වාර්තා කරන දිනයේදී වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම පිළිබඳව වාර්තා කරන ලද සංඛ්‍යාවන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් කිරීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට අවශ්‍ය වේ. කෙසේ වුවද, මෙම උපකල්පනයන්ගේ හා ඇස්තමේන්තු වල තිබෙන්නා වූ අවිනිශ්චිතභාවය හේතුවෙන් අනාගතයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම් වල සැලකිය යුතු ගැලපීම් කිරීමට අවශ්‍ය වන්නා වූ බලපෑම් ඇතිවිය හැකිය. මෙම කාරණයන්හි විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් ඇතුළත් විය හැකිය.

**ඇස්තමේන්තු සහ උපකල්පන**

ඉදිරි මූල්‍ය වර්ෂයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම්හි සැලකිය යුතු ගැලපීම් කිරීමට සිදු වන්නා වූ, විශේෂිත අවදානම් ඇතිවිය හැකි, වාර්තා කරන දිනට පැවති අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පනයන් හා ඇස්තමේන්තු මූලාශ්‍රයන් පහත දක්වා ඇත.

**(අ) මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය**

ශේෂ පත්‍රයෙහි වාර්තා කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳ පොළේ ව්‍යුත්පන්න විය නොහැකි අතර, ඒවා වට්ටම් කළ මූල්‍ය ප්‍රවාහනයන් සහ / හෝ ගණිතමය ආකෘති ඇතුළු ශිල්ප ක්‍රම භාවිතා කරමින් නිශ්චය කර ඇත. මෙම ආකෘති වල යෙදවුම්, හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළෙඳ පොල දත්තයන්ද එවැනි දෑ නොමැති විට විනිශ්චය කිරීමෙන්ම ලබා ගන්නා ලදී.

මෙම සාධකයන් පිළිබඳ උපකල්පනයන්හි වෙනස්වීම් වාර්තා කර ඇති මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය කෙරෙහි බලපෑ හැකිය.

**(ආ) සාධාරණ අගය**

සාධාරණ අගය යනු දැනුමක් හා කැමැත්තක් ඇති පාර්ශව අතර අතේ දුරින් සිදු වූ ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි අගයයි. මූල්‍ය සාධන පත්‍රයක් මුලින්ම හඳුනා ගැනීමේදී එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් ගැනෙන්නේ ලැබූ හෝ ගෙවූ වටිනාකමයි. පසුකාලීනව මූල්‍ය වත්කමක සාධාරණ අගය වන්නේ සක්‍රීය වෙළඳපොලක ඉල්ලුම් කෙරෙන ලංසු තබන මිළයි. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ඉල්ලුම් කරන මිළයි. මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන සඳහා පවත්නා අගය වන්නේ සාධාරණ මිළයි.

## 2. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී හෝ වර්ෂයක් තුළ හෝ යන දෙකින් අඩු කාල සීමාවේදී මුදල් බවට උපලබ්ධි වන ඒවාය.

## 2.2 මූල්‍ය සාධන පත්‍ර

### 2.2.1 මූල්‍ය වත්කම් ( ව්‍යුත්පන්න නොවන )

මූල්‍ය වත්කම් පහත සදහන් කොටස් වලට වර්ගීකරණය කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කළ දෑ , ණය සහ ලැබිය යුතු දෑ , කල් පිරෙන තුරු හෝ විකිණීමට තිබෙන දෑ , මෙම වර්ගීකරණය කළමනාකරණය විසින් නිර්ණය කරන ලද්දේ මූලික හඳුනා ගැනීම හා එම ආයෝජන අත්පත් කර ගැනීමේ අරමුණ පදනම් කොට ගෙනය.

### 2.2.2 වර්ගීකරණය , හඳුනා ගැනීම සහ මැනීම.

කළමනාකරණය විසින් එහි මූල්‍ය වත්කම් පහත සදහන් ලෙස වර්ගීකරණය කරයි.

අ. ණය සහ ලැබිය යුතු දෑ

ආ. විකිණීම සදහා ඇති දෑ

**අ. ණය සහ ලැබිය යුතු දෑ**

ස්ථාවර හෝ සක්‍රීය වෙළෙඳපොලේ මිළ ප්‍රකාශ නොවන, තීරණය වු ගෙවීම් සහිත මූල්‍ය වත්කම්ය. මෙම වත්කම් මුලින්ම සාධාරණ වටිනාකමට එකතු වු සෘජුවම අදාල වන ගණුදෙනු පිරිවැය හඳුනා ගනු ලැබේ. පසුකාලීනව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය කිරීමත් , යම් හානිකරණ පාඩුවක් වේනම් එයත් සැලකිල්ලට ගෙන මනිනු ලැබේ.

**ආ. විකිණීම සදහා ඇති මූල්‍ය වත්කම්**

විකිණීම සදහා ඇති මූල්‍ය වත්කම් යනු නිශ්චිත නොවු කාල පරිච්ඡේදයක් තබා ගැනීමට අදහස් කරන , ද්‍රවශීලතා හේතු හෝ පොලී අනුපාත වෙනස්වීම මත , විනිමය අනුපාත වෙනස්වීම මත හෝ ස්කන්ධ මිළ මත විකිණීමට අවශ්‍ය විය හැකි හෝ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර නොමැති කල් පිරෙන තුරු තබා ගන්නා හෝ ලාභ හෝ අලාභ මත සාධාරණ අගයට වු මූල්‍ය වත්කම්ය.

.

**2.2.3 සාධාරණ අගය නිශ්චය කිරීම.**

ණය සහ අත්තිකාරම් මෙන්ම වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීමේදී වර්තමාන අගය ආකෘතිය එකග වු මුදල් ප්‍රවාහයන් පදනම් කොට ගෙන ණයෙහි ගුණාත්මකභාවයද, ද්‍රවශීලතාව හා පිරිවැයද සැලකිල්ලට ගෙන නිර්ණය කෙරේ. වෙළෙඳ ලැබිය යුතු හා ගෙවිය යුතු අයිතම වල ආසන්න සාධාරණ අගය ලෙස සැලකෙන්නේ පවත්නා වටිනාකමින් හානිකරණය සඳහා අඩු කළ පසු ඉතිරියයි.

**2.2.4 ප්‍රති වර්ගීකරණය**

ණය හා ලැබිය යුතු දැහැර මූල්‍ය වත්කම්, වෙළඳාම සඳහා අයිතමයන්ගෙන් වෙන් කොට වර්ගීකරණය කිරීමට ඉතා කලාතුරකින් ඇතිවිය හැකි පරිසරයකදී හුදෙකලා සිදුවීමක් ලෙස අවසර දෙනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ අතරින් වෙළඳාම සඳහා වු දේ ලෙස ප්‍රති වර්ගීකරණය කිරීම සංස්ථාව විසින් ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අදාළ වන්නේනම් ප්‍රතිවර්ගීකරණය තෝරාගනු ඇත.

ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එසේ කරන දිනට ඇති සාධාරණ අගයටයි. සාධාරණ අගය වන්නේ නව පිරිවැය හෝ ක්‍රමක්ෂය පිරිවැය මතය.

**2.2.5 හානිකරණය**

**(අ) ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍ය වත්කම්**

එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වී ඇති බවට වන සාක්ෂි සංස්ථාව විසින් අගය කෙරේ. වත්කමෙහි ආරම්භක හඳුනා ගැනීමෙන් පසු ඇති වු අවස්ථා එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස ( දරන ලද අලාභ අවස්ථා ) අගය අඩුවීමක පරමාර්ථ සාක්ෂියක් තිබේනම් සහ එම අලාභ අවස්ථාවට මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ හෝ විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තුගත කළ හැකි මූල්‍ය වත්කම්කාණ්ඩයක් මත බලපෑමක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වු බවට සලකනු ලැබේ. අගය අඩුවන බවට වන සාක්ෂි ලෙස , ණයකරුවෙකු හෝ ණයකරුවන් කාණ්ඩයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා වලට මුහුණ දෙමින් සිටින බව පෙන්වීම , පොළියෙහි හෝ මුලධන ගෙවීම් වල පැහැර හැරීම් , ඔවුන් බංකොළොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඇති හැකියාව සහ පැහැර හැරීම් සමඟ සහසම්බන්ධිත ආර්ථික තත්ත්ව හෝ හිඟ මුදල් වල වෙනස්වීම් වැනි

ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල ඇගයිය හැකි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි දත්ත මින් පෙන්වීම , ඇතුළත් විය හැකි වේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් සඳහා , තනි තනි වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනි වශයෙන් අගය අඩුවීම්හි පරමාර්ථ සාක්ෂි තිබේදැයි සංස්ථාව විසින් පළමුවෙන් තනි තනි වශයෙන් අගයන අතර , තනි තනි වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමුහිකව අගයයි. වැදගත් වුවත් , නොවුවත් තනි තනි වශයෙන් අගයනු ලැබූ මූල්‍ය වත්කමක අගය අඩුවීම පිළිබඳ පරමාර්ථසාක්ෂියක් නොමැති බව සමූහය විසින් නිශ්චය කළහොත් එය, එම වත්කම සමාන බැර අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩයක ඇතුළත් කරන අතර ඒවා අගය අඩුවීම සඳහා සාමුහිකව අගයනු ලැබේ. අගය අඩුවීම සඳහා තනි තනි වශයෙන් අගයනු ලැබූ සහ අගය අඩුවීමක් සහිත හෝ දිගින් දිගටම හඳුනා ගැනීමට නියමිත වත්කම් අගය අඩුවීමෙහි සාමුහික ඇගයීමට ඇතුළත් කරනු නොලැබේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ වත්කම් මත අගය අඩුවීමේ අලාභ දරා ඇති බවට පරමාර්ථ සාක්ෂියක් ඇති විට , වත්කමෙහි පවතින වටිනාකම සහ මූල්‍ය වත්කමෙහි මුල් ඵලදායි පොළී අනුපාතිකයට වට්ටම්ගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල වර්තමාන වටිනාකම ( නොදරන ලද අනපේක්ෂිත අනාගත ණය අලාභ හැර ) අතර වෙනසින් අලාභයෙහි ප්‍රමාණය අගයනු ලැබේ. ණයක් සඳහා වෙනස් වන පොළී අනුපාතියක් පවතීනම් යම් අගය අඩුවීමේ අලාභයක් ඇගයීම සඳහා වට්ටම්ගත අනුපාතය වන්නේ වර්තමාන ඵලදායි පොලී අනුපාතයයි. වත්කමෙහි පවතින වටිනාකම දීමනා ගිණුමක් භාවිතා කිරීම හරහා අඩු වන අතර , හානිවන ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. පොලී ආදායම . අඩු වූ පවතින වටිනාකම මත එක්රැස් වීම පවත්වා ගෙන යනු ලබන අතර එය අගය අඩු වීමේ අලාභ ඇගයීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම්ගත කළ පොලී අනුපාතය භාවිතා කරමින් එක් රැස් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයෙහි ආයෝජන ආදායම් වල කොටසක් ලෙස පොලී ආදායම වාර්තා කරනු ලැබේ.අනාගත අය කර ගැනීමෙහි තාත්වික අපේක්ෂාවන් නොමැති විට ආශ්‍රිත දීමනා සමඟින් ණය කපා හරිනු ලබන අතර, සියලු සුරැකුම් සමූහයට උපලබ්ධි කර හෝ පවරාගෙන ඇත. ආසන්න වර්ෂයකදී අගය අඩුවීම හඳුනා ගැනීමෙන් පසු යම් හේතුවක් නිසා ඇස්තමේන්තුගත අගය අඩුවීමේ අලාභය වැඩි වේ නම් හෝ අඩු වේනම් දීමනා ප්‍රමාණය සීරුමාරු කර පෙර හඳුනා ගනු ලැබූ අගය අඩුවීමේ අලාභය වැඩි හෝ අඩු කරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව අය කර ගතහොත් එම අය කිරීම ආදායම් ප්‍රකාශනයෙහි දීමනා (Allowance) ගිණුමට ගලපනු ලැබේ.

**(ආ) <u>අනෙකුත් මූල්‍යමය නොවන වත්කම් හානිකරණය</u>**

වත්කමක පවත්නා අගය අය කර ගත නොහැකි බව පෙනෙන පරිසරයකදී හානිකරණය සඳහා විමසා බැලීමට යටත් වේ. පවතින වටිනාකමඑහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ.

**2.2.6 <u>හඳුනා ගැනීම අත් හැරීම.</u>**

මූල්‍ය වත්කමක් ( හෝ කොටසක් හෝ සමූහයක කොටසක් ඇතුලුව ) හඳුනා ගැනීම අත් හරින අවස්ථා මෙසේය.

- මූල්‍ය ප්‍රවාහයන් ලැබීමේ අයිතිය ඉකුත් වීම.
- සංස්ථාව විසින් වත්කම මගින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය පැවරීම හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් තුන්වන පාර්ශවයකට පවරා දිය යුතු යැයි උපකල්පනය කිරීම.

(අ)සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීම.

(ආ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීමක් හෝ රඳවා ගැනීමක් නොකොට පාලන අයිතිය පැවරීම.

**2.2.7** නීතිමය අයිතියක් ඇති අවස්ථා වල මූල්‍ය වත්කම් හා වගකීම් සමාහරණය කොට ශුද්ධ අගය දක්වා ඇත.

**2.2.8 <u>කොටස් ආයෝජනය</u>**

සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ රු.6.35 බැගින් වූ කොටස් 20,000ක් ආයෝජනය කර ඇත.

## 2.3. දේපළ , යන්ත්‍ර හා උපකරණ

### 2.3.1 හඳුනා ගැනීම හා මැනීම.

දේපළ, යන්ත්‍ර හා උපකරණ අයිතමයන් ඒවායේ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ තක්සේරු අගයට පෙන්වා ඇත. පිරිවැය තුළවත්කම අත් කර ගැනීමේදී දැරූ වියදම් වලින් සෘජුවම අදාල වන වියදම් ඇතුලත් වේ. ස්වයං නිර්මිත වත්කම් වල එම වත්කම් භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ ද්‍රව්‍යය පිරිවැය, සෘජු ශ්‍රමය, සෘජුවම බලපාන වෙනත් අදාල වියදම් ඇතුළත් වේ. අළුත්වැඩියා හා ඉදිරි අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් දරන ලද වියදම් ඒවා දරන අවස්ථාවේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

### 2.3.2 පසුකාලීන පිරිවැය

උපාංග ප්‍රතිපූර්ණය සඳහා දරන ලද වියදම වෙන් වෙන්ව එනම් පූළුල් පරීක්ෂාවන් හා පූර්ණ අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනගත කෙරෙන්නේ ඒවායේ ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හේතු වන්නේනම් හා එම ප්‍රතිලාභ විශ්වාසදායකව මැනිය හැකි නම්ය. දෛනික සේවා කිරීම් ඒවා දරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

### 2.3.3 ක්ෂය වීම්

ක්ෂය සඳහා වෙන් කිරීම සරල මාර්ගක්‍රමය අනුව පිරිවැය/තක්සේරු අගය මත ගණනය කෙරේ. ඉඩම් හැර දේපළ, යන්ත්‍ර හා උපකරණ පහත දැක්වෙන ප්‍රතිශත අනුව ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී ශේෂය ගණනය කෙරේ.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | - | ප්‍රධාන කාර්යාලය | 2.5% |
| | - | ශ්‍රවණාගාරය | 5% |
| චිත්‍රපට සංකීර්ණය | - | ගොඩනැගිලි | 5% |
| | - | අනෙකුත් යන්ත්‍ර සූත්‍ර | 10% |
| ලී බඩු සවි කිරීම් | | | 10% |
| මෝටර් රථ | | | 25% |
| චිත්‍රපට සංරක්ෂණාගාරය | | | 10% |
| සංස්කෘතික / අධ්‍යාපනික / චිත්‍රපට උපකරණ | | | 10% |
| චිත්‍රපට උපකරණ | | | 10% |
| සුභසාධන උපකරණ | | | 10% |
| අස්පෘශ්‍ය වත්ක | | | 20% |

දේපළ පිරියත හා උපකරණ මිළදී ගත් දිනෙන් ආරම්භව ක්ෂය කරනු ලැබේ.

### 2.3.4 හඳුනා ගැනීම ඉවත් කිරීම.

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ ඒවායින් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම නතර වේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය හඳුනා නොගන්නා විට අදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කරනු ලැබේ.

### 2.3.5 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීමක කිසියම් ඇගවීමක් තිබේදැයි නිශ්චය කිරීම සඳහා විලම්භිත බදු වත්කම් හාර සමූහයෙහි මූල්‍යමය නොවන වත්කම් වල පවතින වටිනාකම් ඒ ඒ වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලැබේ. එවැනි තත්ත්වයක් ඇත්නම්, එවිට වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. අවිනිශ්චිත ඵලදායි ආයු කාලයක් සහිත හෝ මේ වන තෙක් භාවිතය සඳහා නොපවතින අස්පෘශ්‍ය වත්කම් සඳහා අය කර ගත හැකි වටිනාකම එක් එක් වර්ෂයේදී එම අවස්ථාවේදීම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහිසාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ. භාවිතයේ ඇති වටිනාකම (Value in use ) ඇගයීමේදී , මුදලෙහි කාලීන අගයෙහි වර්තමාන වෙළෙදපොල ඇගයීම පිළිබිඹු කරනු ලබන බදු පෙර වට්ටම් අනුපාතයක් සහ වත්කමට හෝ මූල්‍ය උත්පාදක ඒකකයට විශේෂිත අවදානම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ.

අගය අඩුවීම පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා තනි තනිව පරීක්ෂා කළ නොහැකි වත්කම් වෙනත් වත්කම් වලින් මුදල් ගැලීමෙන් විශාල වශයෙන් නිදහස් වන නොකඩවා පාවිච්චියෙන් මුදල් ගැලීම උත්පාදනය කරනු ලබන කුඩාම වත්කම් කාණ්ඩයකට කාණ්ඩගත කරනු ලැබේ. අගය අඩුවීමේ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

*වත් උපලේඛනයේ සඳහන් චිත්‍රාගාරයේ ඇති රු.1 අගයට ක්ෂය කර ඇති වත්කම් භාණ්ඩ තව දුරටත් කෞතුක භාණ්ඩ වශයෙන් පවත්වා ගෙන යනු ලබයි.

## 2.4 <u>නොනිමි කාර්යයන්</u>

**ගොඩනැගිලි**

* ලෙස්ටර් ජේම්ස් පීරිස් කෞතුකාගාරය :- අදියර 3කින් කාර්යයන් නිම කිරීමට අපේක්ෂි අතර මේ වන විට පළමු අදියරයේ කාර්යය කොටසක් නිම කර ඇත.
* චිත්‍රාගාරයේ නාමපුවරුව සකස් කිරීම.

**අස්පෘශ්‍ය**

* E – Ticketing System ස්ථාපිත කිරීම සඳහා අත්තිකාරම් ගෙවීම.
*චිත්‍රපටකුලී සංස්ථාභාරය පරිගණක වැඩසටහන් Dos මූලික පද්ධතිය Windows පද්ධතියක් බවට නව මුහුණුවරකට පත්කිරීම.

**වායුසමීකරණ**

*සංස්ථාවේ නව ගොඩනැගිල්ලේ අංශ තුල වායුසමීකරණ ස්ථාපිත කිරීෙ කටයුතු කරමින් පවතී.

## 2.5 තොග

සියළු තොග පිරිවැය හෝ ශුද්ධ ප්‍රත්‍යාගණන අගය යන දෙකින් අවමයට අගය කෙරේ. පිරිවැය පළමු ඇතුළු - පළමු පිට (FIFO) ක්‍රමය පදනම් කොටගෙන තීරණය කෙරේ.

## 2.6 ආදායම් බදු

සංස්ථා සේවකයන්ගේ පඩි හා අනෙකුත් දීමනාද, වියදම් වලින් කොටසක් පියවීම සඳහාද, භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙනු ලැබේ. භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් සඳහා බදු නොගෙවිය යුතුය යන පදනම මත බදු ගෙවීම සඳහා වෙන් කිරීමක් කර නොමැත.

සංස්ථාව විසින් වාර්ෂිකව ලැබූ ලාභය ආදායම් බදු ගෙවීමෙන් පසු ඇති වූ අතිරික්තයෙන් 24% ක ප්‍රමාණයක් ලාභය වෙනුවෙන් බදු ගෙවිය යුතුය යන්න අපගේ මතය වන අතර, එම ප්‍රමාණය විය යුත්තේ ආදායම් බදු සඳහා සිදූ කළ ගැලපුම් කටයුතු වලින් පසු ඉතිරි ශුද්ධ ලාභය යන්න අපගේ විශ්වාසයයි.

## 2.7 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් වල අනෙකුත් ණයගැතියන් සහ ලැබිය යුතු දෑ, අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවීම් , ලැබිය යුතු බදු ඇතුළත් වේ.

### (අ) අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවූ වියදම්

එක් මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලාභ ලැබෙතැයි පෙනෙන යම් සම්බන්ධතාවයක්ඇති වියදම් අත්තිකාරම්, තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කරන ලදී. එවැනි වියදම් කාල පදනම මත අදාළ කාල පරිච්ඡේදය තුළ කපා හරිනු ලැබේ.

**(ආ) <u>අනෙකුත් ණයගැතියෝ</u>**

අනෙකුත් ණයගැතියන් පිරිවැයෙන් හානිකරණය අඩු කළ වටිනාකමට හඳුනාගෙන ඇත.

**2.8 <u>මුදල් සහ මුදල් හා සමාන දෑ</u>**

ඒවායේ සාධාරණ අගයෙහි වෙනස්වීමට නොසැලකිය යුතු තරමේ අවදානමකට භාජනය වන අත්පත් කර ගත් දින සිට මාස 03 ක් කල් පිරුණු හෝ ඊට අඩු කල් පිරීමක් සහිත සහ සමූහය විසින් එහි කෙටිකාලීන වගකීම් කළමනාකරණය සඳහා යොදා ගන්නා මුදල් ශේෂ සහ ඉල්ලුම් තැන්පතු වලින් මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වේ.

භාණ්ඩාගාර බිල්පත් සහ ප්‍රති විකුණුම් බිල්පත් ගිණුම් ගත කිරීමේදී මාස 03 ක් හෝ ඊට අඩු ආයෝජනයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා සමාන ද්‍රවශීල වත්කමක් ලෙස පෙන්වා ඇත.

**<u>සේවක ණය මුදල්</u>**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව මාස 12 ක් ඇතුලත ලැබිය යුතු සේවක ණය මුදල් ජංගම වත්කම් ලෙසත් මාස 12කට වැඩි කාලයකින් පසුව අයවීමට ඇති වටිනාකම් ජංගම නොවන වත්කම් ලෙසත් වර්ගීකරණය කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇත.

| | | |
|---|---|---|
| මාස 12ක් ඇතුලත ලැබිය යුතු සේවක ණය | = | 2,850,400.00 |
| මාස 12කට වැඩි කාලයකින් පසුව ලැබිය අයවීමට ඇති වටිනාකම | = | 17,804,372.84 |
| | | 20,654,772.84 |

## 2.9 මූල්‍ය වගකීම්

### 2.9.1 ආරම්භක හඳුනා ගැනීම හා මැනීම.

LKAS 39 අනුව මූල්‍ය වගකීම් වර්ග කොට ඇත්තේ, උචිත පරිදි ලාභය හෝ අලාභය මඟින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම් හෝ ණය හෝ ණයට ගැනීම්ය. සංස්ථාව එහි මූල්‍ය වගකීම් ආරම්භක හඳුනා ගැනීම අනුව වර්ගීකරණය නිශ්චය කර ඇත. සියළු මූල්‍ය වගකීම් මුලින්ම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර, ණය හා ණය ගැනුම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය ක්‍රමය භාවිතා කරයි. මෙහි සෘජුවම අදාළ වන ගනුදෙනු පිරිවැය ඇතුළත්ය.
සංස්ථාවේ මූල්‍ය වගකීම් වල වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුලත්ය.

### 2.9.2 පසුකාලීන මිනුම්

මූල්‍ය වගකීම් මිනුම පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

### 2.9.3 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් වල වෙළදාම සඳහා වූ මූල්‍ය වගකීම් සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් මත නම් කරන ලද ඒවා ඇතුළත් වේ. මූල්‍ය වගකීම්, වෙළදාම සඳහා පවත්නා දේ ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා නුදුරේදී විකිණීමේ අරමුණ ඇත්නම්ය. වෙළදාම සඳහා වගකීම් මත ලැබීම් හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. සංස්ථාව කිසිදු මූල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මූලික හඳුනා ගැනීම නම් කර නැත.

## 2.10 අනෙකුත් මූල්‍ය වගකීම්

ණය සහ ණය ගැනුම් ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අනෙකුත් මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ක්‍රමාක්ෂය ක්‍රමය භාවිතා කරයි.

**උපචිත වියදම්**

| | රු. |
|---|---|
| ගෙවීමට ඇති වැටුප් | 2,279,444.26 |
| වෙනත් වියදම් | 41,281,268.24 |
| අන්තර් ජාල පහසුකම් සැපයීම | 1,357,000.00 |
| | 44,917,712. 50 |

**2.11 අනෙකුත් වගකීම්**

අනෙකුත් වගකීම් වල උපචිත වියදම් ද ඇතුලත්ය. මේවා ඒවායේ සාධාරණ අගය ලෙස වටිනාකමට දක්වා ඇත.

* වෙනත් ණය හිමියන් යටතේ දක්වන ලද ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල මඟින් දක්වා ඇත්තේ චිත්‍රපට සංවර්ධන අරමුදල මඟින් නිශ්පාදනය කරනු ලැබූ "වැකන්ද වලව්ව" චිත්‍රපටය සංස්ථාව විසින් මිලදී ගැනීම නිසා ඒ වෙනුවෙන් අරමුදල වෙත ගෙවිය යුතු මුදලයි.

* වෙනත් ණයහිමියන් යටතේ දක්වන ලද රිත්මා මණ්ඩල පාලන ගිණුම මඟින් දක්වා ඇති ශේෂයෙහි PVR සිනමාශාලා සඳහා ලද රු. 29,738,603.19 මුදලක් බැර කර ඇත. එම මුදලින් රු. 29,000,000.00 ක මුදලක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත.

| |
|---:|
| 29,738,603.19 |
| (29,000,000.00) |
| 738,603.19 |

**පාරිතෝෂික වෙන් කිරීම්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01ට අනුව සේවක පාරිතෝෂික වෙන් කිරීමේදී ඉදිරි මාස 12 කාලය තුල ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම ජංගම වගකීම් ලෙසත් ඉතිරි පාරිතෝෂික වටිනාකම ජංගම නොවන වගකීම් ලෙසත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇත.

| | රු. |
|---|---:|
| ඉදිරි මාස 12 ක කාලය තුල ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම | 4,719,990.00 |
| ඉතිරි පාරිතෝෂික වටිනාකම | 44,214,793.50 |
| | 48,934,783.50 |

**2.12 රජයේ ප්‍රදාන**

වත්කම් වලට අදාල රජයේ ප්‍රදාන මේවා ශේෂ පත්‍රයේ විලම්භනය කර අදාළ වත්කමේ ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබන අතර, වියදම් පියවීම සඳහා ලැබෙන්නා වු ලැබීම් , ලැබීම් පදනම මත ගිණුම්ගත කෙරේ.

**භාණ්ඩාගාර ප්‍රදානයන් භාවිතය සමඟ නිසි පරිදි ආදායමට හඳුනා ගැනීම.**

LKAS 20 අනුව වත්කම් ගොඩනැගීමට අදාලව රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් වත්කමෙහි ආයු කාලය පුරා ආදායමට හඳුනා ගැනීම 2022 වර්ෂයට හඳුනා ගත් ආදායම් පහත සඳහන් වේ.

| | රු. ශත |
|---|---|
| නව ගොඩනැගිල්ල | 1,308,864.04 |
| ගොඩනැගිල්ල - ප්‍රධාන කාර්‍යාලය | 4,226,511.52 |
| අන්තර්ජාල පහසුකම් | 135,700.00 |
| සිනමා සංකීර්ණය | 5,072,028.74 |
| වැඩ කණ්ඩායම් | 149,945.28 |
| ශබ්ද උපකරණ | 425,437.56 |
| මි.මි. 35 ප්‍රක්ෂේපන යන්ත්‍රය | 135,600.78 |
| ශබ්ද උපකරණ | 43,114.42 |
| කැමරා උපාංග | 68,500.00 |
| 4K වර්ණ සංයෝජන උපාංග | 191,887.50 |
| මෝටර් රථ ප්‍රදානයන් | 3,400,000.00 |
| B.A.W. ජයමාන්න මැදිරිය | 556,202.16 |
| | 15,713,792.00 |

- ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු මුදල - රු. 97,495,000.00 (මෙම මුදල තුල චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල වෙනුවෙන් ලැබුණු රු. 7,500,000.00 ක්ද ඇතුලත් වේ.)
- ආයතනයේ ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු මුදල - රු. 24,837,000.00
- ජනාධිපති ලේ කාර්යාලයෙන් මෝටර් රථ ප්‍රදානයන් - රු. 13,600,000.00

## 2.13 සේවක ප්‍රතිලාභ

**නිර්ණය කළ දායක සැලැස්ම**

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි ප්‍රකාර, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයෝ හිමිකම් ලබති. සංස්ථාව විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත ස්ථාවර දායකයක් මෙකී අරමුදල් වලට ගෙවන අතර, ඉන් අමතරව නීතිමය හෝ හෝ අර්ථකාරී බැදීමක් සංස්ථාව කෙරෙහි නොමැත.

**නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වෙනස් වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැලසුමක් වේ. මේ සම්බන්ධව 1983 අංක.12 දරන පාරිතෝෂික පනත යටතේ සංස්ථාව බැදී සිටී.

**2.14** <u>ආදායම</u>

**2.14.1** <u>ප්‍රධාන ආදායම් මූලාශ</u>

**01. දේශීය හා විදේශීය චිත්‍රපට බෙදා හැරීමේකොමිස්**

දේශීය හා විදේශීයචිත්‍රපට බෙදාහැරීමේදී චක්‍රලේඛ ප්‍රකාරව සංස්ථාව විසින් අයකරනු ලබන කොමිස් මුදල වේ.

**02. වැඩිවීම - සංස්ථාභාරය**

චිත්‍රපට ප්‍රදර්ශනයේදී එක් ප්‍රවේශ පත්‍රයකින් රු.6ක මුදලක් අය කරනු ලබයි.එයින්රු.3.10ක මුදලක් සංස්ථාවට ලැබිය යුතු අතර විදේශීය චිත්‍රපටයකින් එම සම්පූර්ණ රු.3.10 මුදල ද, දේශීය චිත්‍රපටයකින් ලැබෙන රු.3.10න් රු..40ක මුදලක්ද අයකරනු ලබයි.

**03. අධිභාරය**

සිනමාශාලා වලින් ලැබිය යුතු චිත්‍රපට කුළිය සඳහා අයවිය යුතු අධිභාර මුදලින් 75% ක් නොලැබේය යන පදනම මත 25% ක් පමණක් ආදායමට ගෙන තිබේ. 2020 ඔක්තෝබර් මස සිට එම 2.5% ක් වූ මාසික පොලී ප්‍රතිශතය 1% ක් වශයෙන් සංශෝධනය වී ඇත.

**04. පරීක්ෂණ දඩ මුදල්**

සිනමාශාලා වල සිදු වී ඇති අක්‍රමිකතා මත අය කරනු ලබන දඩ මුදල වේ.

**05. ප්‍රචාරණය සඳහා කොමිස් හා සේවාවන් සඳහා කොමිස්**

චිත්‍රපටවල හා සිනමාශාලා වල ප්‍රචාරණ කටයුතු සංස්ථාව මඟින් ඉටු කිරීමෙන් නියෝජිත ආයතන මඟින් සංස්ථාව අය කරනු ලබන කොමිස් හා සේවා ගාස්තු වේ.

**06. චිත්‍රාගාර ආදායම්**

චිත්‍රපට වල පසු නිශ්පාදන කටයුතු (ශබ්ද හා සංස්කරණකටයුතු) සඳහා චිත්‍රාගාර සේවා ලබා දීමෙන් අය කරනු ලබන අදායම් වේ.

**2.14.2 නිෂ්පාදක ණය පොලිය හා අධිභාරය**

නිෂ්පාදකයින් වෙත ලබා දී ඇති ණය මුදල් සඳහා පොළිය ගිණුම්ගත කර ඇත්තේ අදාළ චිත්‍රපට ප්‍රදර්ශනය වී අවුරුද්දක් ගත වන තෙක් පමණි. යම් අවස්ථාවක ණය මුදල් සම්පූර්ණ අය වන්නේනම් අදාල පොලියද ගණනය කර අය කිරීමට කටයුතු කරනු ලැබේ.

සිනමාශාලා වලින් අය වීමට ඇති මුදල් සඳහා ගැසට් නිවේදනයේ පරිදි අධිභාරය ගණනය කර ගිණුම්ගත කර තිබේ.

2022 වසර තුලදී චිත්‍රපට නිෂ්පාදනය සඳහා ගිවිසුම්ගතව ණය ලබා දී නොමැත.

**2.14.3 ප්‍රදර්ශනය සඳහා මුදා හැර ඇති චිත්‍රපට**

චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේදී ආදායම නොලැබීම මත ණය මුදල් අය නොවීමේ තත්ත්වයක් තුළ චිත්‍රපට මුදා හැර වසරකට පසු පොළිය ගිණුම්ගත කරනු නොලැබේ.

**2.14.4 ප්‍රදර්ශනය නොවූ චිත්‍රපට**

**(අ)** චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබා දී ඇති එහෙත් පසුගිය වර්ෂ දෙකක සේවාවන් ලබාගෙන නොමැති චිත්‍රපට වලට පොළිය ගිණුම්ගත කර නොමැත.

**(ආ)** චිත්‍රාගාර සේවා ලබා දීමේදී දීර්ඝ කාලයක් තුළ සේවාවන් ලබා නොගෙන නිෂ්පාදන කටයුතු නවතා ඇති චිත්‍රපට සඳහා පොළිය ගිණුම්ගත කොට නොමැත.

ඉහත සඳහන් කරුණු 02 යටතේ වර්ෂයේ පොළිය ගණනය නොකලද , යම් අවස්ථාවක මෙම ණය මුදල් අය කර ගැනීමේදී පොළිය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**2.14.5 224 ගොඩනැගිලි කුලී ආදායම**

සංස්ථාවට අයිති වත්කමක් වන 224 ගොඩනැගිල්ල තාවකාලිකව කුලීයට දීමෙන් පහත ආයතනයන්ගෙන් ගොඩනැගිලි කුලි අයකරනු ලබයි.

| | | මාසික කුලිය | වාර්ෂිකව |
|---|---|---|---|
| 01. | සැලසිනේ ආ යතනය ( 2021 දෙසැම්බර් සිට 2022 මාර්තු දක්වා) | 315,000.00 | 1,260,000.00 |
| 02. | සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය | 362,000.00 | 4,344,000.00 |
| | | 677,000.00 | 5,604,000.00 |

**ප්‍රසිද්ධ රැඟුම්පාලක මණ්ඩලය**

අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට යටත්ව මාසික ගොඩනැගිලි බදු කුලී තක්සේරු වාර්තාව ලැබීමෙන් අනතුරුව ජාතික චිත්‍රපට සංස්ථාව වෙත 2022 වසරට අදාලව අයවිය යුතු මාසික ගොඩනැගිලි බදු කුලිය ගිවිසුම් ප්‍රකාරව ගිණුම්ගත කර ඇත.

- **අවිනිශ්චිත ගිණුම**

2021.12.31 දිනට හඳුනා නොගත් බැර ශේෂ 2022 ජනවාරි මසදී හඳුනා ගෙන රිසිට් පත් නිකුත් කර ගිණුම්ගත කර ඇත.

## 2.15 පෙර වර්ෂයේ ලාභයට ගැලපීම

| ගණුදෙනුවේ ස්වාභාවය | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| 2022 වසරේ ප්‍රමාදව ලද දෛනික වාර්තා සටහන් කිරීම.<br>RJ 01,02,03,04,07,17,18,41,42,43,44,45,46,52,53 | 2,057.04 | 111,999.76 | (109,942.72) |
| 2021 වර්ෂයේ පාරිතෝෂික වෙන්කිරීම් | 660,280.00 | | 660,280.00 |
| පෙර වර්ෂ වල ආදායම් වියදම් ගිණුම් වල වැරදි නිවැරදි කිරීම.<br>RJ - 10,11,63,64,65<br>GL - 45,46,48,49,50,52,53,55,59,72,73,54,86, 87,88,89,91,117, 118, 121, 125, 128,131 | 273,225.65 | 2,676,494.21 | (2,403,268.56) |
| 2022 ස්ථාවර වත්කම් හඳුනාගැනීමේදී පෙර වර්ෂවලට අදාල සටහන් යෙදීම.<br>RJ 63,113,126 | - | 2,196,767.42 | (2,196,767.42) |
| | 935,562.69 | 4,985,261.39 | (4,049,698.70) |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2022.12.31දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

| | | 2022 | 2021 |
|---|---|---|---|
| **(03) විකුණුම්** | | රු. | රු. |
| **(සටහන 2.14.1)** | සටහන් අංක | | |
| චිත්‍රපට බෙදා හැරීමේ ආදායම් | **3.1** | 55,143,307 | 17,073,689 |
| ප්‍රචාරක ආදායම් | **3.2** | 15,988 | 136,440 |
| චිත්‍රාගාරය | **3.3** | 2,465,593 | 446,900 |
| වෙළඳ කටයුතු | **3.4** | 1,758,973 | 723,353 |
| | | **59,383,861** | **18,380,381** |

**3.1 චිත්‍රපට බෙදා හැරීමේ ආදායම්**

| | | |
|---|---|---|
| දේශීය චිත්‍රපට සඳහා කොමිස් | 8,314,640 | 1,787,816 |
| විදේශීය චිත්‍රපට සඳහා කොමිස් | 38,684,596 | 12,048,742 |
| වැඩිවීම -සංස්ථාභාරය | 6,678,171 | 2,125,971 |
| අධිභාරය | 1,346,100 | 787,461 |
| පරීක්ෂණ දඩ මුදල් | 119,800 | 323,700 |
| | 55,143,307 | 17,073,689 |

**3.2 ප්‍රචාරක ආදායම්**

| | | |
|---|---|---|
| ප්‍රචාරණය සඳහා කොමිස් -සිනේ ඇඩ්ස් | 11,014 | 99,578 |
| සේවාවන් සඳහා කොමිස් | 4,974 | 36,861 |
| | 15,988 | 136,440 |

**3.3 චිත්‍රාගාරය**

| | | |
|---|---|---|
| ශබ්ද | 2,185,568 | 385,425 |
| සංස්කරණය | 280,025 | 61,475 |
| | 2,465,593 | 446,900 |

**3.4 වෙළඳ කටයුතු**

| | | |
|---|---|---|
| සිනමා කාබන් | 199,400 | 127,200 |
| අමතර කොටස් | 66,862 | 50,244 |
| ලිපිද්‍රව්‍යය හා ප්‍රසිද්ධ කිරීම් | 1,428,165 | 491,489 |
| අභ්‍යන්තර භාවිතය | | |
| අමතර කොටස් | 856 | - |
| ලිපි ද්‍රව්‍යය පිරිවැය | 63,690 | 54,420 |
| | 1,758,973 | 723,353 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2022.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**(04) විකුණුම් පිරිවැය**

| | ප්‍රදර්ශන | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | 2022 එකතුව | 2021 එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| තොගය 2022.01.01 | 5,253,887 | 1,409,412 | - | 4,811,813 | 11,475,112 | 11,877,983 |
| එකතු කළා : | | | | | | |
| මිලදී ගැනීම් හා මාරු කිරීම් | - | - | | 1,837,694 | 1,837,694 | 286,610 |
| | 5,253,887 | 1,409,412 | - | 6,649,507 | 13,312,806 | 12,164,593 |
| අඩු කළා : | | | | | | |
| තොග පාඩුවීම් | - | | | | | |
| මාරු කිරීම් | - | | | | | |
| 2022.12.31 අවසන් තොගය | 5,253,887 | 1,409,412 | - | 5,491,294 | 12,154,593 | 11,475,112 |
| | **-** | **-** | **-** | **1,158,212** | **1,158,212** | **689,481** |

දීර්ඝ සටහන් සඳහා ( 4- ඒ ) , ( 4-බී) සහ ( 4- සී ) සටහන් බලන්න.

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## 2022.12.31 දිනට අවසන් වර්ෂයේ

## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**(04 - A)** විකුණුම් පිරිවැය

| ප්‍රදර්ශන | තොගය 2022.01.01 | මිලදී ගැනීම් | එකතුව | තොගය 2022.12.31 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| එළිය කැවු චිත්‍රපට | | | | |
| දේශීය | 3 | - | 3 | 3 |
| බටහිර | 244 | - | 244 | 244 |
| පෙරදිග | 471 | - | 471 | 471 |
| | 718 | - | 718 | 718 |
| මුද්‍රා නොහල චිත්‍රපට | | | | |
| දේශීය | 3,043,931 | - | 3,043,931 | 3,043,931 |
| බටහිර | 982,492 | - | 982,492 | 982,492 |
| පෙරදිග | 8 | - | 8 | 8 |
| එකතුව | 4,026,431 | - | 4,026,431 | 4,026,431 |
| | 4,027,149 | - | 4,027,149 | 4,027,149 |

| | | | 2022 | | 2021 |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| **තොගය 2022.01.01** | | | - | | - |
| එකතු කළා : | මිලදී ගැනීම් | | - | | - |
| | ප්‍රචාරණය | | - | | - |
| | | | - | | - |
| අඩු කළා : | තොගය 2020.12.31 | | - | | - |
| | පිරිවැය | | - | | - |
| එකතු කළා: | අනෙකුත් චිත්‍රපට | | | | |
| **තොගය 2022.01.01** | | | | | |
| I. ප්‍රතිශත පදනම මත | | 259,890 | - | 259,890 | |
| II. සිනේ සිත්තම් | | 966,848 | 1,226,738 | 966,848 | 1,226,738 |
| එකතු කළා : | වියදම් | | - | | - |
| | | | 1,226,738 | | 1,226,738 |
| අඩු කළා : | | | | | |
| | මාරු කිරීම් | | | | |
| **තොගය 2022.12.31** | | | | | |
| I. ප්‍රතිශත පදනම මත | | 259,890 | - | 259,890 | - |
| II. සිනේ සිත්තම් | | 966,848 | 1,226,738 | 966,848 | 1,226,738 |
| **මුළු පිරිවැය** | | | **-** | **-** | **-** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2022.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන් (පොදු පරිපාලන)

**(04 - B)** විකුණුම් පිරිවැය

| | දළ සේයාපට | සිනමා කාබන් | අමතර කොටස් | රසායන ද්‍රව්‍යය | ලිපි ද්‍රව්‍යය | එකතුව 2022 | එකතුව 2021 |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආරම්භක තොගය 2022.01.01 | 287,951 | 897,959 | 238,425 | - | 3,387,477 | 4,811,813 | 5,214,684 |
| එකතු කළා : | | | | | | | |
| මිලදී ගැනීම් හා මාරු කිරීම් | - | - | - | - | 1,837,694 | 1,837,694 | 286,610 |
| | 287,951 | 897,959 | 238,425 | - | 5,225,171 | 6,649,507 | 5,501,294 |
| අඩු කළා : | | | | | | | |
| තොග හානිවීම | | | | | | | |
| 2022.12.31 අවසන් තොගය | 287,951 | 856,810 | 220,399 | - | 4,126,134 | 5,491,294 | 4,811,813 |
| | **-** | **41,149** | **18,026** | **-** | **1,099,037** | **1,158,212** | **689,481** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2022.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන් ( චිත්‍රාගාරය )

**(04 - C)** විකුණුම් පිරිවැය

| | දළ සේයාපට | සිනමා කාබන් | අමතර කොටස් | රසායන ද්‍රව්‍යය | එකතුව 2022 | එකතුව 2021 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආරම්භක තොගය - 2022.01.01 | 816,569 | - | 538,753 | 54,090 | 1,409,412 | 1,409,412 |
| මිලදී ගැනීම් | - | - | - | - | - | - |
| | 816,569 | - | 538,753 | 54,090 | 1,409,412 | 1,409,412 |
| අඩු කළා : | | | | | | |
| තොග හානිවීම | - | - | - | - | - | - |
| මාරු කිරීම් | - | - | - | - | - | - |
| 2022.12.31 අවසන් තොගය | 816,569 | - | 538,753 | 54,090 | 1,409,412 | 1,409,412 |
| වර්ෂය තුළ අභ්‍යන්තර පාවිච්චිය | - | - | - | - | - | - |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2022.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**සටහන : 05**

**සේවක පාරිශ්‍රමිකය**

| | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| වැටුප් හා වේතන | 49,601,980.40 | 51,807,354 |
| අතිකාල, නිවාඩු පඩි හා වන්දි | 2,895,216.47 | 8,521,229 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදලට දායක මුදල් | 10,781,470.17 | 11,342,867 |
| වෙනත් දීමනා | 25,471,830.63 | 17,838,122 |
| | 88,750,497.67 | 89,509,572 |

**සටහන : 06**

**ගමන් හා යැපීම් දීමනා**

| | | 2022 | 2021 |
|---|---|---|---|
| ගමන් වියදම් | ( දේශීය ) | 249,320.30 | 49,453 |
| | ( විදේශීය ) | - | - |
| යැපීම් දීමනා | | 178,544.20 | 378,908 |
| | | 427,864.50 | 428,361 |

**සටහන : 07**

**සැපයුම් හා උපකරණ**

| | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| ලිපි ද්‍රව්‍යය හා කාර්යාලීය උපකරණ | 2,763,760 | 1,563,315 |
| විදුලිය (සටහන් අංක 09හි සඳහන් වේ) | - | 3,766,120 |
| සංග්‍රහ වියදම් (සටහන් අංක 09හි සඳහන් වේ) | - | 134,240 |
| විදුලි උපකරණ | 79,675 | 173,656 |
| | 2,843,435 | 5,637,331 |

**සටහන : 08**

**අළුත්වැඩියා කිරීම් , නඩත්තු හා ක්ෂයවීම්**

ඉන්ධන, ලිහිසි තෙල් හා රථවාහන නඩත්තු

| | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| රක්ෂණය - රථවාහන | 234,305 | 129,880 |
| ඉන්ධන ගාස්තු | 1,181,823 | 1,093,643 |
| රථ වහාන අලුත්වැඩියාව හා නඩත්තු | 1,143,240 | 2,044,896 |
| රථවාහාන බලපත්‍ර | 17,200 | 46,730 |
| මිලට ගැනීම - මොටර් රථ අමතර කොටස් | - | 173,356 |
| නඩත්තු | 2,150,307 | 3,276,184 |
| ක්ෂයවීම් (සටහන 11) | - | 18,510,514 |
| | 4,726,876 | 25,275,202 |

**සටහන : 08A**

| | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| ක්ෂයවීම් (සටහන 11) | 27,141,801 | - |
| | 27,141,801 | - |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2022.12.31 දිනට අවසන් වර්ෂයේ**

**ආදායම් ප්‍රකාශන සඳහා සටහන්**

**සටහන : 09**

| | 2022 | 2021 |
|---|---|---|
| **ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවාවන්** | රු. | රු. |
| **ප්‍රවාහනය** | 141,632 | 160,761 |
| **සම්බන්ධතා** | - | 1,419,122 |
| **සන්නිවේදන වියදම්** | 1,420,479 | - |
| **අවශ්‍යතා** | | |
| අභ්‍යන්තර පාවිච්චිය | 64,546 | 54,420 |
| සුභසාධක වියදම් | 1,887,781 | 2,236,902 |
| සේවක බඳවා ගැනීම් හා පුහුණුව | 130,930 | 81,043 |
| ජල බිල්පත් | 100,199 | 144,595 |
| සාකච්ඡා හා සම්මන්ත්‍රන | - | 78,970 |
| චිත්‍රපට සංරක්ෂණය | 170,452 | 165,239 |
| වරිපනම් බදු | 829,313 | 829,313 |
| විදුලිය | 4,293,344 | - |
| | | - |
| **වෙනත් සේවා** | | |
| අධ්‍යක්ෂක මණ්ඩල වියදම් හා විගණන කමිටු වියදම් | 332,303 | 793,906 |
| ප්‍රචාරණය | 122,784 | 421,247 |
| විශේෂ නියෝජිත ආයතන | 345,740 | 186,971 |
| විනය පරීක්ෂණ ගාස්තු | 658,433 | 372,205 |
| නීති ගාස්තු | 366,870 | 213,106 |
| සංස්ථා උත්සව | 1,286,564 | 133,587 |
| විදේශ චිත්‍රපට උළෙලයන් | - | 37,742 |
| විගණන ගාස්තු | 1,000,000 | 1,200,000 |
| ආරක්ෂක සේවා | 8,208,381 | 7,945,830 |
| බැංකු ගාස්තු | 74,301 | 60,665 |
| සිනමා අධ්‍යාපන ඩිප්ලෝමාව | 623,850 | 697,965 |
| පිටස්තර මරණාධාර හා සිනමා ශිල්පීය වියදම් | 178,000 | 340,000 |
| නව සිනමාහලේ නඩත්තු වියදම් | 343,532 | 371,577 |
| තිර පිටපත් කියවීම | 235,500 | 138,000 |
| ප්‍රමාද ගාස්තු | 2,179 | 1,423 |
| සනිපාරක්ෂක සේවා | 4,559,625 | 2,945,688 |
| චිත්‍රපට වර්ගීකරණ වියදම් | - | - |
| විදේශ චිත්‍රපට රූගත කිරීමේ රාජකාරී සඳහා විමර්ශන නිලධාරීන්ට - ගෙවීම් | 1,036,500 | 375,000 |
| කාර්මික උපදේශක සේවා | - | 150,000 |
| අවශ්‍යතා - ප්‍රක්ෂේපණ යන්ත්‍ර කුලියට ගැනීම | 12,000 | - |
| වත්කම් ප්‍රත්‍යාගනනය | 6 | - |
| ටෙන්ඩර් වියදම් | 105,019 | - |
| විවිධ වියදම් | 7,850 | - |
| සංග්‍රහ වියදම් | 104,091 | - |
| | 28,642,201 | 21,555,276 |

**සටහන : 09A**

| | | |
|---|---|---|
| ජනාධිපති සිනමා උළෙල සඳහා වියදම් | 35,000,000 | - |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2022.12.31 දිනට අවසන් වර්ෂයේ**

**ආදායම් ප්‍රකාශන සඳහා සටහන්**

| **සටහන : 10**<br>**වෙනත් ආදායම්** | **2022**<br>රු. | **2021**<br>රු. |
|---|---|---|
| ලාභාංශ ආදායම | - | - |
| නිෂ්පාදන ණය පොලී | 50,833 | - |
| සේවක ණය පොලී | 622,742 | 679,011 |
| විවිධ ආදායම් | 120,721 | 446,800 |
| චිත්‍රාගාරයේ පිටස්තර රූගත කිරීම් | 2,358,518 | 2,300,205 |
| තත්ත්ව පරීක්ෂා | - | - |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොලී | 54,115,725 | 17,388,383 |
| චිත්‍රපට ලියාපදිංචි ගාස්තු - දේශීය විදේශීය | 905,000 | 545,000 |
| එන්.එෆ්.සී. සිනමාහලේ ආදායම | 692,500 | 610,000 |
| චිත්‍රපට නැරඹීම සඳහා ලැබීම් | - | - |
| තිරපිටපත් සඳහා අනුමැතිය | 276,500 | 183,500 |
| 224 ගොඩනැගිලි කුලී ආදායම (සටහන 2.14.5) | 8,839,000 | 9,937,000 |
| පාඨමාලාවන් සඳහා ලැබීම් | 1,430,000 | 2,580,000 |
| භාණ්ඩාගාර ලැබීම් ආදායමට හඳුනා ගැනීම් (සටහන 19) | 15,713,792 | 11,757,590 |
| විනිමය අනුපාත ගැලපීම | 725,518 | 62,900 |
| දේශන ශාලාවේ කුලී ආදායම් | 84,375 | 43,625 |
| රක්ෂණ සංස්ථාවෙන් ලද වන්දි | - | - |
| ප්‍රචාරක පුවරු | 310,500 | 217,500 |
| වාර්ෂික ලියාපදිංචි ගාස්තු - විදේශ චිත්‍රපට ආනයනකරුවන් | 1,000,000 | 500,000 |
| විදේශීය වාර්තාමය චිත්‍රපට සඳහා අනුමැතිය | 3,256,000 | 1,104,000 |
| විමර්ශන නිළධාරී ලැබීම් | 1,276,500 | 348,000 |
| ටෙන්ඩර් තැන්පතු ගාස්තු | 146,456 | - |
| | **91,924,679** | **48,703,513** |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2022 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

| සටහන : 11 - ස්ථාවර වත්කම් දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | පිරිවැය | පෙර වර්ෂයේ පිරිවැය වෙනුවෙන් කල ගැලපීම් | වර්ෂය තුල එකතු කිරීම් | වර්ෂය තුල ඉවත් කිරීම් | පිරිවැය | සමුච්චිත ක්ෂයවීම් | පෙර වර්ෂයේ ක්ෂය වෙනුවෙන් කල ගැලපීම් | වර්ෂය සඳහා ක්ෂයවීම් | සමුච්චිත ක්ෂයවීම් | ශුද්ධ අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2022.01.01** | | | | **2022.12.31** | **2022.01.01** | | | | **2022.12.31** |
| | රු. | | රු. | රු. | රු. | රු. | | රු. | රු. | රු. |
| **01.** සින්නක්කර ඉඩම් | 174,343,458 | | - | | 174,343,458 | - | | - | - | 174,343,458 |
| **02.** සින්නක්කර ගොඩනැගිලි | 144,587,017 | | 6,161,901 | | 150,748,918 | 78,739,243 | | 6,914,428 | 85,653,671 | 65,095,247 |
| **03.** සිනමා සංකීර්ණය | 122,882,932 | | 630,429 | | 123,513,361 | 88,914,712 | | 5,135,072 | 94,049,784 | 29,463,577 |
| **04.** මිනි සිනමා උපකරණ | 331,451 | | | | 331,451 | 331,449 | | - | 331,449 | 2 |
| **05.** ලී බඩු , සවි කිරීම් හා වැද්දුම් | 23,478,712 | | - | | 23,478,712 | 18,813,766 | | 746,333 | 19,560,099 | 3,918,613 |
| **06.** කාර්යාලීය උපකරණ | 29,096,204 | | 711,000 | | 29,807,204 | 21,656,030 | | 1,389,672 | 23,045,702 | 6,761,502 |
| **07.** මෝටර් රථ | 18,182,879 | | 40,050,000 | 18,181,429 | 40,051,450 | 18,182,871 | 18,181,423 | 10,012,500 | 10,013,948 | 30,037,502 |
| **08.** චිත්‍රපට සංරක්ෂණය | 2,104,455 | | - | | 2,104,455 | 1,760,688 | | 210,446 | 1,971,133 | 133,322 |
| **09.** පාපැදි | 18,281 | | - | | 18,281 | 18,277 | | - | 18,277 | 4 |
| **10.** චිත්‍රපට උපකරණ | 910,689 | | - | | 910,689 | 910,669 | | - | 910,669 | 20 |
| **11.** ප්‍රක්ෂේපණ උපකරණ | 1,158,152 | | 205,900 | | 1,364,052 | 793,791 | | 88,385 | 882,176 | 481,876 |
| **12.** චිත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර | 103,679,649 | | 4,907,723 | 2,525,000 | 106,062,371 | 94,022,006 | 1,771,500 | 1,922,580 | 94,173,086 | 11,889,285 |
| **13.** සිනමා අධ්‍යාපන උපකරණ | 1,241,350 | | 992,900 | | 2,234,250 | 1,236,287 | 68,500 | 223,425 | 1,391,212 | 843,038 |
| **14.** සුහසාධන උපකරන | 210,677 | | - | | 210,677 | 202,818 | | 1,572 | 204,389 | 6,287 |
| | **622,225,906** | **-** | **53,659,853** | **20,706,429** | **655,179,330** | **325,582,607** | **20,021,423** | **26,644,411** | **332,205,596** | **322,973,734** |
| 11A **අස්පෘශ්‍ය** | | | | | | | | | | |
| අස්පෘශ්‍ය වත්කම් | 2,486,950 | | - | | 2,486,950 | 795,330 | | 497,390 | 1,292,720 | 1,194,230 |
| | **2,486,950** | **-** | **-** | **-** | **2,486,950** | **795,330** | **-** | **497,390** | **1,292,720** | **1,194,230** |
| **නොනිමි කාර්යය** | **(සටහන 2.4)** | | | | | | | | | |
| **1** ගොඩනැගිලි | 31,261,321 | 813,470 | - | 11,642,995 | 18,804,857 | - | - | - | - | 18,804,857 |
| **2** කාර්යාල උපකරණ | 634,700 | - | - | 634,700 | - | - | - | - | - | - |
| **3** වායු සමීකරණ | 7,149,211 | - | - | - | 7,149,211 | - | - | - | - | 7,149,211 |
| **4** අස්පෘශ්‍ය වත්කම් | 6,308,291 | 106,875 | 17,330,000 | 6,201,416 | 17,330,000 | - | - | - | - | 17,330,000 |
| | **45,353,522** | **920,345** | **17,330,000** | **18,479,111** | **43,284,067** | **-** | **-** | **-** | **-** | **43,284,067** |
| මුළු වත්කම් | **670,066,378** | **920,345** | **70,989,853** | **39,185,540** | **700,950,347** | **326,377,938** | **20,021,423** | **27,141,801** | **333,498,316** | **367,452,031** |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2022 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

| | | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| සටහන : 12 | | | |
| දිගු කාලීන ආයෝජන | | | |
| ස්ථාවර තැන්පතු | | 141,687,000 | 195,895,798 |
| කොටස් ආයෝජනය-සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | | 127,000 | 127,000 |
| (සටහන 2.2.8 ) | | 141,814,000 | 196,022,798 |
| | | | |
| සටහන : 13 | | | |
| කෙටි කාලීන ආයෝජන | | | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සේවක | | 5,000 | 5,000 |
| රිපෝ තැන්පතු | | - | 106,845,577 |
| භාණ්ඩාගාර බිල්පත් | | 82,614,991 | - |
| | | 82,619,991 | 106,850,577 |
| | | | |
| සටහන : 14 | | | |
| තොග | | | |
| චිත්‍රපට | | 5,253,887 | 5,253,887 |
| වෙළඳ කටයුතු | | 5,203,343 | 4,523,862 |
| චිත්‍රාගාරය | | 1,697,363 | 1,697,363 |
| චිත්‍රාගාරය නඩත්තු අමතර කොටස් | | 1,472,575 | 1,472,575 |
| ලිපි ද්‍රව්‍යය හා වෙනත් | | 2,151,953 | 3,184,904 |
| | | 15,779,121 | 16,132,591 |
| සෙමින් අලෙවි වන සහ අලෙවි නොවන තොග සඳහා වෙන් කිරීම් | | (8,597,176) | (8,597,176) |
| | | 7,181,945 | 7,535,416 |
| | | | |
| සටහන : 15A | | | |
| ණයගැතියෝ | | | |
| සිනමාහල් | 411,680,539 | | |
| (-) අධිභාර වෙන් කිරීම් | (161,855,343) | | |
| (-) ණයගැතියන් සඳහා හානිකරණ ගැලපීම **(සටහන 16 ඒ)** | (123,233,150) | 126,592,045 | 104,936,581 |
| | | | |
| සටහන : 15B | | | |
| නිෂ්පාදකයෝ | 83,517,103 | | |
| (-) නිෂ්පාදන ණය පොලි වෙන් කිරීම් | (4,618,806) | | |
| (-) ණයගැතියන් සඳහා හානිකරණ ගැලපීම (සටහන 16 ඒ) | (68,421,039) | 10,477,259 | 13,505,327 |
| | | 137,069,304 | 118,441,907 |
| | | | |
| සටහන : 16 | | | |
| විවිධ ණයගැතියෝ | | | |
| වෙනත් | | | |
| ලැබිය යුතු කොමිස් මුදල් - රිත්මා මණ්ඩලය | | 198,699,363 | 158,256,916 |
| ලැබිය යුතු පොලි ( ස්ථාවර / රිපෝ) | | 22,047,838 | 6,837,861 |
| ලැබිය යුතු සංස්ථා භාරය - රිත්මා මණ්ඩලය | | 25,942,686 | 22,191,472 |
| ලැබිය යුතු මුදල් ගිණුම 224 | | 20,759,870 | 12,437,643 |
| විවිධ ණයගැතියෝ සඳහා හානිකරන ගැලපීම (සටහන 16 ඒ) | | (13,372,488) | (9,986,195) |
| | | | |
| සේවක වැටුප් හා වේතන පාලන ගිණුම | | 1,830,870 | 1,345,954 |
| මාස 12 ක් ඇතුලත ලැබිය යුතු සේවක ණය | | 2,850,400 | 321,250 |
| | | 258,758,538 | 191,404,901 |
| සටහන : 16 -1 | | | |
| මාස 12කට වැඩි කාලයකදී අය වීමට ඇති සෙවක ණය | | 17,804,373 | 16,506,775 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2022 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

**අඩමාන ණය සඳහා වෙන් කිරීම් උපලේඛනය**

සටහන : 16 ඒ

| ණයගැතියෝ | එකතුව 2022 | එකඟ නොවූ හා අය කර ගත නොහැකි | අය කර ගත හැකි | 5% වෙන් කිරීම් | මුළු වෙන් කිරීම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| සිනමාහල් | 411,680,539 | 108,051,709 | 303,628,830 | 15,181,441 | 123,233,150 |
| නිෂ්පාදකයන් | 83,517,103 | 67,626,509 | 15,890,594 | 794,530 | 68,421,039 |
| වෙනත් | 267,449,757 | | 267,449,757 | 13,372,488 | 13,372,488 |
| සේවක ණය | 20,654,773 | - | 20,654,773 | - | - |
| | **783,302,171** | **175,678,218** | **607,623,953** | **29,348,459** | **205,026,677** |

| | | සිනමාහල් | නිෂ්පාදකයන් | වෙනත් |
|---|---|---|---|---|
| ශේෂය ඉ / ගෙ | 185,612,282 | 112,250,315 | 63,375,773 | 9,986,195 |
| ලාභාලාභ ගිණුමට මාරු කළා | 19,414,395 | 10,982,835 | 5,045,266 | 3,386,293 |
| | **205,026,677** | **123,233,150** | **68,421,039** | **13,372,488** |

ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම්

| | |
|---|---|
| 2022.01.01 දිනට | 185,612,282 |
| ලාභාලාභ ගිණුමට මාරු කළා | 19,414,395 |
| ශේෂය ප/ගෙ 2022.12.31 | **205,026,677** |

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## 2022 දෙසැම්බර් 31 දිනට

## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

| | 2022 | 2021 |
|---|---|---|
| සටහන : 17 | රු. | රු. |
| තැන්පතු හා ඉදිරියට ගෙවීම් | | |
| තැන්පතු | 4,653,854 | 3,925,436 |
| අත්තිකාරම් ගෙවීම් | 499,034 | 87,443 |
| සුබ සාධක සංගමයට මරණාධාර අත්තිකාරම් | - | - |
| | 5,152,888 | 4,012,880 |
| ණය සඳහා හානිකරන ගැලපීම | (653,728) | (653,728) |
| | 4,499,160 | 3,359,152 |

| | 2022 | 2021 |
|---|---|---|
| සටහන : 18 | | |
| මුදල් හා බැංකු ශේෂ | | |
| මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-1-0208647 | 588,542 | 373,994 |
| මහජන බැංකුව - ජ. ගි. අ. 055-1-001-5-0667533 | 1,690,173 | 1,046,786 |
| මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-6-0208664 | 5,585,038 | 2,080,681 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323272 | 1,670,951 | 2,218,557 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323131 | 936,902 | 712,999 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323354 | 34,981,111 | 19,438,606 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323363 | 12,701,701 | 3,456,070 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0005002189 | 3,370,426 | 2,191,823 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 5152460 | - | - |
| | 61,524,844 | 31,519,517 |
| අත ඉතිරි මුදල් | | |
| සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | - | - |
| සුළු මුදල් - චිත්‍රාගාරය | - | - |
| සුළු මුදල් - චිත්‍රපට ගබඩාව | 34 | 34 |
| | 34 | 34 |
| මාස 03ට කල් පිරෙන තැන්පතු | | |
| රිපෝ තැන්පතු | | 21,935,375 |
| භාණ්ඩාගාර බිල්පත් | 20,800,938 | 4,068,536 |
| ස්ථාවර තැන්පතු | 148,355,855 | |
| | 169,156,793 | 26,003,911 |
| එකතුව | 230,681,670 | 57,523,462 |

| | 2022 | 2021 |
|---|---|---|
| සටහන : 19 | | |
| ප්‍රදානයන් | | |
| භාණ්ඩාගාර ප්‍රදානයන් | 114,731,345 | 101,651,934 |
| (-)ක්‍රමක්ෂය | (12,313,792) | (11,757,590) |
| | 102,417,553 | 89,894,345 |
| මෝටර් රථ ප්‍රදානයන් | 13,600,000 | - |
| (-)ක්‍රමක්ෂය | (3,400,000) | - |
| | 10,200,000 | - |
| එකතුව | 112,617,553 | 89,894,345 |

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2022 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

| | | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| සටහන : 20 | | | |
| පාරිතෝෂික වෙන් කිරීම් | | | |
| ඉදිරියට ගෙනා ශේෂය - 2022.01.01 | | 49,002,597 | 51,335,634 |
| 2022 ට පෙර ගැලපීම් | | 660,280 | (1,775,311) |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | | 2,009,657 | 2,443,174 |
| මුදල් ගෙවීම් | | (2,737,750) | (3,000,900) |
| | | 48,934,784 | 49,002,597 |
| සටහන : 20-1 | | | |
| ඉදිරි මාස 12න් පසු ගෙවීම් | | 44,214,794 | 48,057,987 |
| සටහන : 20-2 | | | |
| ඉදිරි මාස 12 තුල ගෙවීම් (2023.12.31 දක්වා) | | 4,719,990 | 944,610 |
| සටහන : 21 | | | |
| තැන්පතු | | | |
| එන්.එෆ්.සී. සිනමාශාලා ඇප තැන්පතු | | 475,272 | 465,272 |
| ආපනශාලා තැන්පතු | | 30,000 | 30,000 |
| ආරක්ෂක තැන්පතු - | සිනමාශාලා | 2,326,727 | 2,326,727 |
| | සේවක | 5,000 | 5,000 |
| | චිත්‍රපට ආනයන | 7,500 | 7,500 |
| | සිනමා ව්‍යාපෘතිය | 45,000 | 45,000 |
| | සනිපාරක්ෂක සේවා | 160,000 | 160,000 |
| | | 3,049,499 | 3,039,499 |
| සටහන : 22 | | | |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | | | |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | | 330,280,811 | 263,037,778 |
| (-) ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම | | (18,046,804) | (18,046,804) |
| | | 312,234,007 | 244,990,974 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2021 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

| | 2022 | 2021 |
|---|---|---|
| සටහන : 23 | රු. | රු. |
| **මූල්‍ය වගකීම්** | | |
| උපචිත වියදම් (සටහන් අංක 2.10) | 44,917,713 | 53,565,690 |
| | 44,917,713 | 53,565,690 |

| | 2022 | 2021 |
|---|---|---|
| සටහන : 24 | | |
| **වෙනත් ණයහිමියෝ** | | |
| ගෙවිය යුතු එකතු කල අගය මත බදු | 152,612 | 152,612 |
| විගණන ගාස්තු ප්‍රතිපාදන | 2,200,000 | 2,178,000 |
| දේශීය ආදායම් කොමසාරිස් (මුද්දර) | 30,673 | 41,648 |
| හිමිකම් නොපැවේතන | 539,152 | 539,152 |
| සේවක අර්ථසාධක අරමුදල | 591,842 | 656,759 |
| සේවක භාරකාර අරමුදල | 70,375 | 72,955 |
| විවිධ ණයහිමියෝ | 759,734 | 857,755 |
| (-) නොගෙවිය යුතු වගකීම් සඳහා වෙන් කිරීම් | (644,840) | (644,840) |
| ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල (සටහන් අංක 2.11) | 3,525,795 | 3,525,795 |
| රිත්මා මණ්ඩල පාලන ගිණුම | 35,504,261 | 5,220,133 |
| උපයන විට බදු ගෙවීම | 38,253 | 38,253 |
| වැටුප් හා වේතන වෙන් කිරීමේ ගිණුම | 577,190 | 577,190 |
| ලැබිය යුතු නිෂ්පාදන ණය පොලී වෙන් කිරීම | - | 1,028,122 |
| ප්‍රසිද්ධ රුගුම් පාලක මණ්ඩලය | 114,801 | 114,801 |
| චිත්‍රපට කළාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් පාලන ගිණුම | - | - |
| චිත්‍රපට ප්‍රතිශ්ඨාපනය | - | - |
| සිලොන් බිස්කට් සමාගම | 976,303 | 976,303 |
| අවිනිශ්චිත ගිණුම | - | 52,680 |
| ජනාධිපති චිත්‍රපට සම්මාන උළෙල සඳහා වෙන්කිරීම් | 35,000,000 | - |
| ජනාධිපති චිත්‍රපට සම්මාන උළෙල සඳහා ලද ප්‍රදානයන් | 50,000 | |
| | 79,486,152 | 15,387,318 |

අධ්‍යක්ෂ මණ්ඩලය - 2022. 01.01 දින සිට 2022 මැයි මාසය තෙක් වර්ෂය

| අනු අංකය | නම | තනතුර | ලිපිනය |
|---|---|---|---|
| 1 | ආචාර්ය ජයන්ත ධර්මදාස | සභාපති, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව | ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව , අංක.303, බෞද්ධාලෝක මාවත , කොළඹ 07 |
| 2 | මොහාන් සමරනායක මහතා | ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව , නො. 163, කිරුළපන මාවත, කොළඹ 05 |
| 3 | චන්ද්‍රපාල ලියනගේ මහතා | අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව , නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 |
| 4 | තරණී අනෝජා ගමගේ මහත්මිය | සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව , 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල |
| 5 | ආචාර්ය ධම්මික දිසානායක | කථිකාචාර්ය - සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය | අංක.2/2, පුරහල නිවාස සංකීර්ණය, නයිවල, වේයන්ගොඩ |
| 6 | මහාචාර්ය කෝලිත භානු දිසානායක | පීඨාධිපති - පශ්චාත් උපාධි අධ්‍යයන අංශය , සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය | අංක.561/1, ගල්ඒදණ්ඩ පාර, ගෝනවල, කැළණිය |
| 7 | ආචාර්ය රවීන්ද්‍ර රන්දෙණිය | ප්‍රවීණ රංගන ශිල්පී | අංක 283 ඒ, පරණ නුවර පාර, දළුගම, කැළණිය |
| 8 | ධම්මිත් ෆොන්සේකා මහතා | ප්‍රවීණ රංගන ශිල්පී | අංක.140/33, කලාපුර, ටෙම්ප්ලර්ස් පෙදෙස, ගල්කිස්ස. |
| 9 | එන්.පී.ඒ.ආර්. ජයවර්ධන මහත්මිය, | භාණ්ඩාගාර නියෝජිත | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව , මහාභාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01 |
| 10 | ඩබ්ලිව්.ඒ.ජේ.සී.වික්‍රමආරච්චි මහත්මිය | භාණ්ඩාගාර නියෝජිත | අධ්‍යක්ෂ වැ.බ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තුමේන්තුව , මුදල් අමාත්‍යාංශය. |
| 11 | ජූඩ් නිලුක්ෂාන් මහතා | භාණ්ඩාගාර නියෝජිත | අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තුමේන්තුව |
| 12 | තිලක් හෙට්ටිආරච්චි මහතා | අතිරේක ලේකම් (ප්‍රවර්ධන), බුද්ධශාසන හා ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | බුද්ධශාසන හා ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| 13 | කේ.ඒ.ඩී.ආර්.නිශාන්ති ජයසිංහ මහත්මිය | ලේකම්, ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය |

**2022 අගෝස්තු මස සිට චිත්‍රපට සංස්ථාව සඳහා නව සභාපතිවරයකු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කිරීමට රෙජීය අමාත්‍යවරයා විසින් කටයුතු කර ඇත .**

| අනු අංකය | නම | තනතුර | ලිපිනය |
|---|---|---|---|
| 1 | නීතිඥ පී.එම්. දීපාල් චන්ද්‍රරත්න මහතා (2022.08.08 සිට) | සභාපති, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව | ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව , අංක.303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. |
| 2 | දිනිත් චින්තක කරුණාරත්න මහතා (2022.09.15 සිට) | රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ,කොළඹ 05 |
| 3 | නලින් කුමාර නිශ්ශංක මහතා (2022.08.10 සිට) | අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ,කොළඹ 07. |
| 4 | තරණී අනෝජා ගමගේ මිය (2022.08.10 සිට) | සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව , 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. |
| 5 | ජනාධිපති නීතිඥ ජගත් වික්‍රමනායක මහතා (2022.10.14 සිට) | ජනාධිපති නීතිඥ | 1174, ධම්මෝදය මාවත, බත්තරමුල්ල. |
| 6 | ඇෂ්ලි රත්නවිභූෂණ මහතා (2022.08.08 සිට) | සිනමා ක්ෂේත්‍රය නියෝජනය | 118, දෙහිවල, බොරලැස්ගමුව. |
| 7 | නදීකා ගුණසේකර (2022.08.08 සිට) | සිනමා ක්ෂේත්‍රය නියෝජනය | නො.552 බී,වෙස්ට්බරි පාර්ක්,විජේසි හ මාවත,පැලවත්ත, බත්තමුල්ල. |
| 8 | පී.පී.එස්.ආර්. ද සිල්වා මහතා (2022.11.09 සිට) | අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව(භාණ්ඩාගාර නියෝජිත) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව , මහ ලේකම් කායාලය (3 වන මහල), කොළඹ 01. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. CAA/D/SNFC/1/2022/18

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 නොවැම්බර් 12 දින


සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 03 හා 08 ඡේද ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වාර්තා කරන දිනය හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය හිමිවන දින අතරතුර කාලයේදී, මූල්‍ය ප්‍රකාශන වාර්තා කරන දිනට පැවති තත්ත්වය පිළිබඳව සාක්ෂි සපයන ගනුදෙනු යථෝක්ත මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතු වුවද, සංස්ථාවට එරෙහිව පැවති නඩු 02 ක් සම්බන්ධයෙන් ලබාදී තිබූ තීන්දු ප්‍රකාරව අදාල නිලධාරින්ට ගෙවිය යුතු රු.4,645,296 ක හිඟ වැටුප් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි


ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
20 NOV 2023
සභාපති කාර්යාලය
CHAIRMAN'S OFFICE


(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 34 වන ඡේදය ප්‍රකාරව සංස්ථාවේ දේපළ පිරියත හා උපකරණ වල සාධාරණ අගය කාලීනව වෙනස්වීම් මිත ඒවා විත්කම් විසර




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත්, සංස්ථාව විසින රු.441,813,407 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් එකතුව රු.154,976,666 ක් වටිනා ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති අතර ප්‍රමිතයේ අංක 79(ආ) ඡේදය ප්‍රකාරව එම වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. ඒ අනුව එම වත්කම්වල ඵලදායී ජීව කාලය පිළිබඳ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සෙමින් චලනය වන සහ චලනය නොවන තොගයෙහි මුළු වටිනාකම රු.8,597,176 ක් විය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 79 (අ) ඡේදය ප්‍රකාරව නිශ්කාර්ය වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ පොත් අගයට හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථා පරිශ්‍රය තුළ හා ඉන් පිටත සංස්ථාවට අයත් ගොඩනැගිලි තුළ පවතින නිශ්කාර්ය වත්කම් හා යල් පැනගිය පැරණි වත්කම් පිළිබඳ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. එම තොගයෙහි වටිනාකම සනාථ කරගැනීම සඳහා අවශ්‍ය විස්තරාත්මක ලේඛන විගණනයට ඉදිරිපත් නොවිය.

(ඉ) 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් 2 ක පැවති එකතුව රු. 19,812,600 ක් වූ ශේෂයන්ට අනුරූපී වන අයුරින් එකතුව රු. 21,263,945 ක හර හා එකතුව රු. 1,451,345 බැර වටිනාකම් ඇතුලත් කර සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් සටහන් කර තිබුණි. එම හර හා බැර ශේෂයන් සනාථ කිරීමට අදාල ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

(ඊ) 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් 03 ක ශේෂයන්ගේ එකතුව රු. 5,346,024 ක් වුවත් එම ලෙජර් ගිණුම්වල සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස එකතුව රු.7,357,214 ක් දක්වා තිබීමෙන් ශේෂයන් අතර රු.2,011,190 ක වෙනසක් පැවතුණි.

(උ) ලෙජර් ගිණුම් අංක 60-1271 හා 70-3422 යටතේ දැක්වුණු සේවක ණය පොළී (වත්කම්) හා (වගකීම්) ගිණුම් 02 හි පැවති රු. 1,467,383 ක හර හා බැර ශේෂයන් එකිනෙකට හිලව් කර තිබුණද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මේ පිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඌ) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය අනුව වර්ෂ අවසාන සමුච්චිත ලාභය රු. 441,170,247 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ලෙජරය අනුව ආරම්භක ශේෂය රු. 431,752,693 ක් ලෙස දක්වා තිබුණි.

(එ) ණයගැති ගිණුමට සටහන් කරන ලද රු. 329,577,291 ක හර කිරීම් හා රු.291,649,659ක බැර කිරීම්වලට අදාල ජර්නල් වවුචර් 02 ක් සහ වටිනාකම රු. 599,276,716 ක් වූ ජර්නල් වවුචර් 135 කට අදාල අනුෂාංගික ලේඛන/ලිඛිත සනාථන විගණනයට ඉදිරිපත් නොවිය.

(ඒ) සංස්ථාවේ පරිගණක ගිණුම්කරණ පද්ධතිය (Quick Book) තුලින් ලබා ගන්නා ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව මුළු වත්කම්වල වටිනාකම රු. 1,103,950,458 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එම වටිනාකම රු.1,247,881,012 ක් වූයෙන් එම ශේෂ අතර රු.143,930,554 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඔ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් නොවන, රු.13,600,000 ක් වූ මෝටර් රථ ප්‍රදාන සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයට ගලපන ලද රු. 26,450,000 ක් වූ මෝටර් රථ ප්‍රත්‍යාගණන ලාභය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් චලනය කෙරෙහි බලනොපාන විෂයයන් යටතේ දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් වටිනාකම රු.30,939,853 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල එම වටිනාකම රු.70,989,853 ක් ලෙස දක්වා තිබුණි.

(ක) 2022 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛනය අනුව චිත්‍රපට කුලී ණයගැති ශේෂය රු. 439,289,504 ක් වුවත් එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එම ශේෂය රු. 411,680,539 ක් වූයෙන් එම ශේෂ අතර රු.27,608,965 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ග) 2022 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට කුලී ණයගැතියන්ට අදාල රු. 161,855,343 ක අධිභාර වෙන්කිරීම් වටිනාකම තහවුරු කර ගැනීමට අදාල උපලේඛන හා පැරණි චිත්‍රපට කුලී ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.27,789,043 ක ශේෂයන් සම්බන්ධයෙන් වයස් විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොවිය.

(ජ) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයෙන් 2021 වර්ෂය සඳහා ලැබිය යුතු රු.960,000 ක ගොඩනැගිලි කුළී ගිණුම්ගත කර නොතිබීමෙන් ලැබිය යුතු කුළිය හා සමුච්චිත ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණු අතර එම මණ්ඩලය විසින් 2019 වර්ෂයේ සිට 2022 මැයි දක්වා බදුකුලී මුදලින් නව ගොඩනැගිල්ල ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද වියදම් වෙනුවෙන් හිලව් කර ගෙන තිබුණු රු. 13,120,000 ක මුදල ගිණුම්ගත කිරීමට හා හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද නව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් එම මණ්ඩලයට ගෙවිය යුතු මුදල හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ට) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පැවති රු. 20,654,773 ක් වූ සේවක ණය ශේෂය තුල රු. 545,052 ක හඳුනාගත නොහැකි ණය ශේෂයක් පැවතුණි .

(ඩ) 2022 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ උපලේඛන අනුව ණයහිමි ශේෂය රු.364,301,563 ක් වුවත් එදිනට ලෙජරය අනුව එම ශේෂය රු.330,280,811 ක් වූයෙන් රු.34,020,752 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ණ) සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද පාරිතෝෂික දීමනා රු. 2,323,223 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු.2,737,750 ක් ලෙස දක්වා තිබුණු අතර ඒ අනුව රු. 414,527 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ත) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල මුදල් නොවන වෙනස්වීම් යටතේ ගැලපිය යුතු පාරිතෝෂික සඳහා වෙන්කිරීම්වල වැඩිවීමේ

වටිනාකම රු. 2,009,657 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල ගලපන ලද එම වටිනාකම රු. 2,669,937 ක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව . මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ (අ), (ආ), (ඇ) සහ (ඒ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 4 (ඌ) වගන්තිය | ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපොල පර්යේෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ III වන කොටස 16 (2) ඡේදය සහ 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි මෙහෙයුම් අත්පොතේ 6.6 | කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සංස්ථාවේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 05ක ප්‍රමාදයකින් පසුව 2023 ජූලි 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(අ) සහ (ආ) ඡේද | 2021 වර්ෂය වන විට සංස්ථාව සතුව මෝටර් රථ 14 ක් පැවති අතර, 2020 වර්ෂයේ සිටම වාහන 06 ක් ධාවනයෙන් ඉවත් කර තිබුණි. 2022 වර්ෂය වන විට මෝටර් රථ 05 ක් පමණක් ධාවනයේ යොදවා තිබූ අතර, මෙම චක්‍රලේඛය ප්‍රකාරව අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ ධාවනය නොකරන වාහන අපහරණය කිරීමට ක්‍රියාකර නොතිබුණි. |
| (ඈ) | 1971 අංක 38 දරන මුදල් පනතේ වගන්ති අංක 14 සහ 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්ති | අදාළ මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත භාෂා 03 කින් යුත් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව තුළ සභාගත කළ යුතු වුවද, සංස්ථාවේ 2018,2019 සහ 2020 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි 2.3 ඡේදය | ජාතික චිත්‍රපට සංස්ථාවේ 2022 වර්ෂය ආවරණය කරමින් උපාය මාර්ගික සැලැස්මක් සකස් කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් කරුණු

(අ) 2021 නොවැම්බර් 23 දින පැවති අංක 1204 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ධාවනයෙන් ඉවත් කර තිබූ GB- 1371 වෑන් රථය විධිමත් පටිපාටින්ට අනුව අළුත්වැඩියා කර භාවිතයට ගැනීම සඳහා අනුමැතිය ලබාදී තිබුණද අවුරුදු 02 කට ආසන්න කාලයක් ගත වී ඇතත් මෙම වෑන් රථය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදනය සහ සිනමාශාලා නවීකරණය සඳහා ලබාදී ඇති ණය මුදල් වලින් එකතුව රු. 83,517,103 ක් සහ සිනමාශාලා වලින් ලැබිය යුතු හිඟ මුදල් රු.411,680,538 ක් ඇතුළුව එකතුව රු.495,197,641 ක ලැබිය යුතු මුළු මුදලින් එකතුව රු.348,464,266ක් අධිහාර සහ අඩමාණ ණය ලෙස වෙන්කිරිම නිසා එදිනට අයකරගත හැකි ශුද්ධ ණය ශේෂය රු.146,733,375 ක් විය. තවද විගණනයට ඉදිරිපත් කරන ලද සිනමාශාලා ණයගැති කාල විශ්ලේෂණයට අනුව රු. 214,135,368 ක ණයගැති ශේෂ වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන අතර එම මුදල් විධිමත්ව හා කාලීනව අයකර ගැනීමට සංස්ථාව විසින් පියවර ගෙන නොතිබුණි.

(ඇ) සංස්ථාව වෙත ලැබිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා කමිටුවක් පත්කර තිබූ අතර විගණිත දින වූ 2023 සැප්තැම්බර් 05 දින වන විටත්, 2023 වර්ෂය වෙනුවෙන් කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණු අතර හිඟ මුදල් අයකර ගැනීමට අදාල නිර්දේශ ඉදිරිපත් කිරිමටද කමිටුව අපොහොසත් වී තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ආසන්න වසර 10 ක හිඟ ණය සහ හිඟ මුදල් විධිමත් ක්‍රමවේදයකට අනුව අයකර ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින්ද උපදෙස් ලබාදී තිබුණද එම උපදෙස් ප්‍රකාරව හිඟ ණය අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඈ) වසර 05 කට පෙර සිට පැවත එන සංස්ථාවේ සුබසාධන සංගමයෙන් ලැබිය යුතු රු. 354,000 ක් හා ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලෙන් ප්‍රදර්ශිත චිත්‍රපට වෙනුවෙන් ලැබිය යුතු රු.1,360,404 ක් අයකරගත නොහැකි ශේෂය තුල දක්වා තිබූ අතර සංස්ථාවේ අභ්‍යන්තර අංශ අතර සිදු වූ ගනුදෙනු මත ඇතිව තිබූ මෙම ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 870,659 ක් වූ දළ සේයාපට සහ රසායනාගාර ද්‍රව්‍ය තොගය 2014 වර්ෂයේ සිට කාලය ඉකුත්වීම සහ වර්තමානයේ භාවිතා නොකිරීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවති අතර පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දී තිබුණද, මෙම නිෂ්කාර්යය වත්කම් අපහරණය කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.44,917,713 ක් වූ උපචිත වියදම් වලින් රු. 4,523,718 ක උපචිත වියදම් වසර 05 කට පෙර සිදු වූ ගණුදෙනු වෙනුවෙන් ගෙවීම් කිරිම සඳහා විය. මේ අනුව උපචිත වියදම් කඩිනමින් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(උ) සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මු.ති.කො. 9848 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.1235ක ඉඩමෙහි පිහිටා තිබුණි. මෙම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීමකින් තොරව එහි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය ඇතුළු ගොඩනැගිලි කිහිපයක් ඉදිකර එහි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

(ඌ) සංස්ථාවට අයත් අංක 224 දරන පරිශ්‍රයේ පිහිටි දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහල අංක 4660 දරන බදු ගිවිසුම ප්‍රකාරව 2019 ජනවාරි 14 දින දක්වා මසකට රු.315,000ක බදු කුළී පදනම මත සංස්ථාව විසින් සැලසිනේ රූපවාහිනී ආයතනය වෙත ලබාදී තිබුණි. බදු ගිවිසුම යාවත්කාලීන කිරීමකින් තොරව සහ එකතුව රු.12,111,000 ක් වූ හිඟ බදු මුදල් ගෙවීමකින් තොරව ගොඩනැගිල්ල භාවිතා කර 2022 මාර්තු 28 දින ගොඩනැගිල්ල නැවත සංස්ථාව වෙත භාරදී තිබුණි. 2022 ඔක්තෝබර් මස දක්වා මෙම හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2022 මාර්තු 28 දිනෙන් පසුව මෙම ගොඩනැගිල්ල ඵලදායී කාර්යයක යොදවා නොතිබුණි.

(එ) තොග සමීක්ෂණ පත්‍රිකා අනුව භෞතිකව නොමැති රු. 5,253,887 ක් වටිනා චිත්‍රපට තොගයක් අවසාන තොගය තුල ඇතුලත්ව තිබූ අතර එම තොග සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඒ) තොග සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව දළුගම විත්‍රාගාරයේ ගබඩාව සතු තොග ලෙජර බොහෝමයක් වේයන් විනාශ කර තිබීම හේතුවෙන් තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි නොතිබීම මත චිත්‍රාගාරය සතු වූ රු.3,169,938 ක් වටිනා තොගය සත්‍යාපනය කර නොතිබුණි. විගණිත දින වූ සැප්තැම්බර් 18 දින වන විටත් කළමනාකාරිත්වය විසින් තොග ලේඛන නැවත සකස් කර තොග සත්‍යාපනය කිරීමට අදාළ පියවර ගෙන නොතිබුණි.

ව තිසි

(ඔ) සංස්ථාවේ ප්‍රධාන ගබඩාව තුළ වර්ෂ වසර 10 ඉක්මවූ චිත්‍රපට සඟරා 7,692 ගබඩා ඉඩකඩ අසුරාලමින් නිශ්කාර්යව පැවතුණි. සංස්ථාවේ ලේඛන මඟින් පිරිවැය හෝ වර්තමාන අගය හඳුනාගත නොහැකි මෙම ද්‍රව්‍ය පිළිබඳ පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වාදී තිබූ අතර, හානියට පත්වෙමින් පැවති මෙම ද්‍රව්‍ය අපහරණය කිරීමට කළමනාකරණය පියවර ගෙන නොති ණි.

බු

(ඕ) දේශීය හා විදේශීය චිත්‍රපට බෙදාහැරීමේ කොමිස් මුදල සංස්ථාවේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රයක් වන අතර කාලයක් තිස්සේ පෞද්ගලික ආයතන මඟින්ද චිත්‍රපට බෙදාහැරීම සිදුකර තිබුණි. අංක අමප/21/1024/305/022 හා 2021 ජූනි මස 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් චිත්‍රපට බෙදාහැරීම හා ප්‍රදර්ශනයට අදාල ක්‍රමවේදය සංස්ථාවට පවරා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණද විගණිත දින වූ 2023 සැප්තැම්බර් දක්වා යථෝක්ත කරුණ ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කර ක්‍රියාත්මක කිරීමට සංස්ථාවේ ඉහළ කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ක) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ VII වන කොටස 40 (1) ඡේදය ප්‍රකාරව අදාළ ආයතනය සඳහා තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවද අභ්‍යන්තර විගණක සහ අභ්‍යන්තර විගණන අංශයේ සේවය කළ නිලධාරිනිය, 2021 වර්ෂයේ දෙසැම්බර් සිට සංස්ථා සේවයෙන් ඉවත් වීමෙන් පසුව සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය අක්‍රියව පැවතිණි.

(ග) ආචාර්ය "ලෙස්ටර් ජේම්ස් පීරිස්" මහතා නමින් සංස්ථා පරිශ්‍රය තුළ කෞතුකාගාරයක් සහ පුස්තකාලයක් ඉදිකිරීම සඳහා ඉදිකිරීම් සහ උපදේශනාත්මක කටයුතු සඳහා ඇස්තමේන්තුගත එකතු වටිනාකම රු.99,965,061 කට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා දීමට ද්විපාර්ශවික ගිවිසුමකට එළඹ 2019 අප්‍රේල් 05 දින එහි ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියේ සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් රහිතව ආරම්භ කළ මෙම ඉදිකිරීම වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.3,134,107 ක් ගෙවීම් කර තිබුණි. පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දුන් මෙම ඉදිකිරීමේ කටයුතු වසර 04 කට වැඩි කාලයක සිට අතහැර දමා තිබූ අතර, ඉදිකිරීම් ආරම්භ කළ මෙම ගොඩනැගිල්ලේ ඇති යකඩ කූරු දැඩි ලෙස හායනයට ලක්වීම නිසා ගොඩනැගිල්ල විනාශ වෙමින් පැවතුණි.

(ජ) සංස්ථාවේ වියදම් පියවා ගැනීමට ආදායම් ප්‍රමාණවත් නොවීම මත 2001 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයෙන් සේවක වැටුප් හා ප්‍රාග්ධන වැය සඳහා ප්‍රතිපාදන සලසාදී තිබුණි. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක කාලය තුළ සංස්ථාව භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර දිගින් දිගටම මෙහෙයුම් අලාභ ලබන තත්ත්වයක පැවතීම හේතුවෙන් වර්තමානය වනවිට රජයේ මූල්‍ය සහය හා කෙටිකාලීන තැන්පතු පොළී ආදායම් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඒ) තොග සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව දළුගම චිත්‍රාගාරයේ ගබඩාව සතු තොග ලේඛන බොහෝමයක් වේයන් විනාශ කර තිබීම හේතුවෙන් තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි නොතිබීම මත චිත්‍රාගාරය සතු වූ රු.3,169,938 ක් වටිනා තොගය සත්‍යාපනය කර නොතිබුණි. විගණිත දින වූ සැප්තැම්බර් 18 දින වන විටත් කළමනාකාරීත්වය විසින් තොග ලේඛන නැවත සකස් කර තොග සත්‍යාපනය කිරීමට අදාලව නිසි පියවර ගෙන නොතිබුණි.

(ඔ) සංස්ථාවේ ප්‍රධාන ගබඩාව තුළ වර්ෂ වසර 10 ඉක්මවූ චිත්‍රපට සඟරා 7,692 ගබඩා ඉඩකඩ අසුරාලමින් නිශ්කාර්යව පැවතුණි. සංස්ථාවේ ලේඛන මඟින් පිරිවැය හෝ වර්තමාන අගය හඳුනාගත නොහැකි මෙම ද්‍රව්‍ය පිළිබඳ පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වාදී තිබූ අතර, හානියට පත්වෙමින් පැවති මෙම ද්‍රව්‍ය අපහරණය කිරීමට කළමනාකරණය පියවර ගෙන නොතිබුණි.

(ඕ) දේශීය හා විදේශීය චිත්‍රපට බෙදාහැරීමේ කොමිස් මුදල සංස්ථාවේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රයක් වන අතර කාලයක් තිස්සේ පෞද්ගලික ආයතන මඟින්ද චිත්‍රපට බෙදාහැරීම සිදුකර තිබුණි. අංක අමප/21/1024/305/022 හා 2021 ජූනි මස 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් චිත්‍රපට බෙදාහැරීම හා ප්‍රදර්ශනයට අදාල ක්‍රමවේදය සංස්ථාවට පවරා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණද විගණිත දින වූ 2023 සැප්තැම්බර් දක්වා යථෝක්ත කරුණ ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කර ක්‍රියාත්මක කිරීමට සංස්ථාවේ ඉහළ කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ක) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ VII වන කොටස 40 (1) ඡේදය ප්‍රකාරව අදාළ ආයතනය සඳහා තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවද අභ්‍යන්තර විගණක සහ අභ්‍යන්තර විගණන අංශයේ සේවය කළ නිලධාරිනිය, 2021 වර්ෂයේ දෙසැම්බර් සිට සංස්ථා සේවයෙන් ඉවත් වීමෙන් පසුව සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය අක්‍රීයව පැවතිණි.

(ග) ආචාර්ය "ලෙස්ටර් ජේම්ස් පීරිස්" මහතා නමින් සංස්ථා පරිශ්‍රය තුළ කෞතුකාගාරයක් සහ පුස්තකාලයක් ඉදිකිරීම සඳහා ඉදිකිරීම් සහ උපදේශනාත්මක කටයුතු සඳහා ඇස්තමේන්තුගත එකතු වටිනාකම රු.99,965,061 කට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා දීමට ද්විපාර්ශවික ගිවිසුමකට එළඹ 2019 අප්‍රේල් 05 දින එහි ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියේ සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් රහිතව ආරම්භ කළ මෙම ඉදිකිරීම වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.3,134,107 ක් ගෙවීම් කර තිබුණි. පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දුන් මෙම ඉදිකිරීමේ කටයුතු වසර 04 කට වැඩි කාලයක සිට අතහැර දමා තිබූ අතර, ඉදිකිරීම් ආරම්භ කළ මෙම ගොඩනැගිල්ලේ ඇති යකඩ කූරු දැඩි ලෙස හායනයට ලක්වීම නිසා ගොඩනැගිල්ල විනාශ වෙමින් පැවතුණි.

(ජ) සංස්ථාවේ වියදම් පියවා ගැනීමට ආදායම් ප්‍රමාණවත් නොවීම මත 2001 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයෙන් සේවක වැටුප් හා ප්‍රාග්ධන වැය සඳහා ප්‍රතිපාදන සලසාදී තිබුණි. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක කාලය තුළ සංස්ථාව භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර දිගින් දිගටම මෙහෙයුම් අලාභ ලබන තත්ත්වයක පැවතීම හේතුවෙන් වර්තමානය වනවිට රජයේ මූල්‍ය සහය හා කෙටිකාලීන තැන්පතු පොළී ආදායම් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ බදුදීම

(i) සංස්ථාපිත පයින් අංක 224 දරන පරිශ්‍රයේ පිහිටි තනි මහල් ගොඩනැගිල්ල 2007 වර්ෂයේ සිට ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය වෙත බදු කුළී පදනමට ලබාදී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් බදු ගිවිසුමේ සහ 2017 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලය වෙනුවෙන් 2017 ජනවාරි 23 දින අතර ඇති කරගත් බදු ගිවිසුමේ ඇතුලත් කොන්දේසි පිළිපැදීමට දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධ ඇතත් ගිවිසුමේ සඳහන් අංක 06 හා 08 කොන්දේසි කඩ කරමින් බදුදී තිබූ ගොඩනැගිල්ල කඩා ඉවත් කර වර්ග අඩි 2576 ක නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.

(ii) 224 දරන පරිශ්‍රයේ පිහිටි නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ මූලික කටයුතු 2016 මැයි 16 දින ආරම්භ කර 2017 ජනවාරි 08 දින මුල් ගල තබා තිබුණු අතර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වසරක පමණ කාලයක් ගතවීමෙන් පසු 2017 අප්‍රේල් 27 දින පාලක මණ්ඩලය විසින් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල අනුමැතිය ලබාදීම තහවුරු කර තිබුණි.එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් නව ගොඩනැගිල්ල ඉදිකිරීම. එහි අයිතිය හා වියදම් පියවීම සම්බන්ධ කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iii) නව කුළී ගිවිසුමක් ඇති කර ගැනීමට අදාල තක්සේරු වාර්තා ලබාගැනීමේ ප්‍රමාදය හේතුවෙන් 2019 ජනවාරි 01 දින සිට 2022 මැයි 31 දක්වා කාල සීමාවට අදාලව බදු කුලිය සඳහා ගිවිසුම්ගත වී නොතිබුණි. විධිමත් ගිවිසුමකට එළඹෙන තෙක් සංශෝධනයන්ට යටත්ව 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ඇස්තමේන්තුගත රු. 400,000 ක් වූ මාසික කුලියෙන් සියයට 20 ක් මුදලින් හා ඉතිරි සියයට 80 ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද පිරිවැයට හිලව් කිරීමටත් දෙපාර්තමේන්තුව එකඟ වී තිබුණ ද 2023 මාර්තු 14 වන තෙක්ම බදු ගිවිසුමකට එළඹීමට අපොහොසත්ව තිබුණි.

(iv) අවසන්වරට ඇතුලත්ව තිබුණු ගිවිසුම අවසන් වී වසර 04 කට පසු 2022 ජූනි 01 දින සිට 2024 මැයි 31 දින දක්වා වසර 02 ක කාලසීමාව වෙනුවෙන් 2023 මාර්තු 14 දින නව ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුමේ ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයට ගෙවිය යුතු මුදල පිළිබඳව කොන්දේසි ඇතුලත් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

